ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නව වැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභා වාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව

2022 දෙසැම්බර් මස 06 දින ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය සම්බන්ධයෙන් පැවති

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලැබූ පියවර.

අංකය	කාරණය	කාරක සභාවේ නිර්දේශ	වගකිව යුතු නිලධාරියා	අංක SJGH/IAD/AGR-2019,2020/COPE-2022 හා 2023.05.11 දිනැති ලිපිය අනුව ප්‍රගතිය වාර්තා කිරීම	නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලැබූ පියවර
01.	උපදේශක කාර්ය මණ්ඩලය 1983 අංක 54 දරන ජයවර්ධනපුර රෝහල් මණ්ඩල පනත අනුව උපදේශක කාර්යය මණ්ඩලය සමන්විත වන්නේ අමාත්‍යතුමා විසින් පත් කරන විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනෙකුගෙන් යුක්ත වීම සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු විය. මෙහිදී, කාර්යය මණ්ඩලයෙන් තිදෙනෙක් උපදේශක කාර්ය මණ්ඩලය සඳහා පත් කරන එවන ලෙස අමාත්‍යාංශයෙන් ආයතනයේ සභාපතිතුමාට දැනුම් දෙන බවත්, ඒ අනුව එක් එක් අංශවල විශේෂඥ වෛද්‍යවරුන් මේ වන තෙක් උපදේශකයින් ලෙස පත් කල බවත් කාරක සභාවට අනාවරණය විය. උපදේශකයින්ගේ විශේෂ කාර්යභාරය කුමක්දැයි කාරක සභාව විමසන ලදුව, • ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස ක්‍රියා කරන බවත්, • විශේෂඥ වෛද්‍යවරුන් 45 දෙනා අතුරින් 3 නෙකු ඒ සඳහා පත් කරන බවත්, තවදුරටත් කාරක සභාවට අනාවරණය විය. කාර්ය මණ්ඩලයේ තිදෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම ගැටලු සහගත බැවින් ඒ පිළිබඳව කාරක සභාව තවදුරටත් ප්‍රශ්න කරන ලදි. කාර්ය මණ්ඩලයේ තිදෙනෙක් අධ්‍යක්ෂ	i. උපදේශක මණ්ඩලය පිළිබඳව ඉදිරියේදී ගනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳව මසක් ඇතුළත කාරක සභාවට වාර්තා කිරීම. ii. මීට පෙර පැවති ඒකාබද්ධ සාකච්ඡාවකදී එකගතාවය ලබා දී තිබූ පරිදි මෙම රෝහල් පනත සංශෝධනය කර තීරණ ගන්නා කණ්ඩායම් පත් කිරීම සහ උපදේශකයන් නොමැතිව කාර්යය මණ්ඩලය නියෝජනය වන පරිදි කමිටු පත් කිරීමත් ක්‍රියාත්මක වී නොමැති බැවින්, එම තීරණ ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් සභාපතිගේ අංක SJGH/ IAD/ AGR - 2019, 2020/ COPE-2022 හා 2023.05.11 දිනැති ලිපිය අනුව ප්‍රගතිය වාර්තා කර ඇත.	**<u>රෝහල් පනත වෙනස් කිරීම</u>** "1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර රෝහල් අධ්‍යක්ෂ මණ්ඩල පනත සංශෝධනය කිරීම" යන මාතෘකාව යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2023.08.23 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර රෝහල් අධ්‍යක්ෂ මණ්ඩල පනත සංශෝධනය කිරීමට නිල කමිටුවක් පත් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් 2023.09.04 දින කැබිනට් අනුමැතිය හිමි විය. ඒ අනුව, 2023.10.11 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කමිටුව පත් කරන ලදී. සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වූ කමිටුව විසින් ලබාදුන් සංශෝධන ඇතුළත් කරමින් කමිටු වාර්තාව සකස් කරන ලදී. 2024.01.17 වන දින රෝහල් බලධාරීන් සහ අදාළ ඉහළ නිලධාරීන් සමඟ රැස්වීමක් පවත්වා යම් යම් කරුණු නැවත සාකච්ඡා කර වෙනස්කම් කිහිපයක් යෝජනා කරන ලදී. යෝජිත නව සංශෝධන සහිත කැබිනට් පත්‍රිකාවක් ඉදිරියේදී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට සූදානම් කරමින් පවතී.

	මණ්ඩලය නියෝජනය කරන බැවින්, මෙහිදී ළැදියාවෙන් අතර ගැටුමක් (conflict of interest) පවතින බව නිරීක්ෂණය කළ කාරක සභාව මේ පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී. ඒසේම තවදුරටත් කාරක සභාව පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන ලදී. • ඇතැම් රාජ්‍ය ආයතනවල අදාළ ඇමතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේදී වෘත්තීය සමිති නියෝජිතයන් සහ සේවකයින් සම්බන්ධ කර ගන්නා බවත්. • මෙම රෝහල ද උපාධිධාරීන් පුහුණු කරන රෝහලක් මෙන්ම වෘත්තීය මට්ටමේ රෝහලක් බැවින්ද, ළැදියාවන් අතර ගැටුමක් පවතින බැවින් ද ඒ සම්බන්ධයෙන් පවතින නීතිය වෙනස් කළ යුතු බව, • එසේ නොමැති නම් මෙම උපදේශකයින් ලෙස විශ්ව විද්‍යාලවල මහාචාර්යවරු පත් කර ගැනීම, • මෙම අධ්‍යක්ෂ මණ්ඩලය තුල පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ඇතුළත්ව සිටින බව, • එසේම,සායනික පරීක්ෂණ වලට පැමිණෙන වෛද්‍යවරු මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ගැනීමට කාරක සභාව විසින් යෝජනා කිරීම, • වෘත්තීය සමිති සහ සේවකයින්ගේ අදහස්ද ලබා ගැනීම සඳහා ඔවුන් සමඟද සාකච්ඡා කිරීම.	iii. මෙම ආයතනය දිගින් දිගටම පාඩු ලබන ආයතනයක් බැවින් වෘත්තීය දැනුම ඇති පුද්ගලයින් මෙන්ම ව්‍යාපාර කළමනාකරණ මට්ටමේ දැනුම ඇති පුද්ගලයින් ද උපදේශක සභාවට හෝ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීම.	රෝහල් සභාපති		**<u>කළමනාකරණ උපදේශක සභාවක් පත් කර ඇත.</u>** පිරිවැය කළමනාකරණය සහ රෝහල් කළමනාකරණය සඳහා අවශ්‍ය නිර්දේශ හා යෝජනා ලබා ගැනීම සඳහා රෝහලේ සියලුම කාර්ය මණ්ඩලය සහ වෘත්තීය සමිති නියෝජනය වන පරිදි මේ වන විට කළමනාකරණ උපදේශක සභාවක් පත් කර ඇත. **<u>වෘත්තීය හා ව්‍යාපාර කළමනාකරණය දැනුම ඇති පුද්ගලයින් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සම්බන්ධ කර ගැනීම.</u>** ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩල පනත සංශෝධනය කිරීමේදී, වෘත්තීය දැණුම ඇති පුද්ගලයින් මෙන්ම ව්‍යාපාර කළමනාකරණ දැණුම ඇති පුද්ගලයින් උපදේශක සභාවට හෝ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සම්බන්ධ කර ගැනීම සඳහා වූ යෝජනා නව කැබිනට් මණ්ඩල පත්‍රිකාව මඟින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

02.	**<u>රෝහලේ වර්තමාන තත්වය හා එහි සංවර්ධනය.</u>** මෙම රෝහල අවට නාගරික මධ්‍යම පන්තියක් නියෝජනය කරන බවත්, එබැවින් මෙම රෝහල පෙරට වඩා සංවර්ධනය විය යුතු බවත්, ප්‍රදේශය අවට තරහකාරී ලෙස නවීන උපකරණ සහ පහසුකම් සහිත පුද්ගලික රෝහල් ආරම්භ කර තිබෙන බවත් , ඒ බැවින් රෝහල් කළමනාකරණය යම් කිසි නවීකරණ වැඩ පිළිවෙලක් මෙන්ම සේවාවන් විවිධාංගිකරණය කිරීමක් අවශ්‍ය බවත්, දන්ත වෛද්‍ය සායනයක් සහ අංශභාග රෝගීන් සඳහා ඒකකයක් පිහිටුවීමේ රෝහලේ යෝජනාව කාලීනව වැදගත් බවත්, මේ සඳහා සංයුක්ත කළමනාකරණ සැලැස්මක් සෑදිය යුතු බවත් කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.				**<u>රෝහලේ වර්තමාන තත්වය හා එහි සංවර්ධනය.</u>** රෝහල් සේවාවන් විවිධාංගීකරණය කිරීමට ලක් කිරීම සඳහා මේ වන විට පියවර රැසක් ගෙන ඇත. එනම්, • ප්‍රතිකාර ගෙන රෝහලින් බැහැර යන රෝගීන් සඳහා නියම කරන බෙහෙත් රෝගීන් වෙත ලබාදීමට කටයුතු කිරීම. • නිවසේ සිටින රෝගියා වෙතට ගොස් ප්‍රතිකාර ලබාදීමේ Pre Hospital Care සේවාව ආරම්භ කිරීම සඳහා සැළසුම් කර ඇත. • බාහිර ප්‍රතිකර ඒකකය (OPD) පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. • Pain Management සායනයක් ආරම්භ කර ඇත. • විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා සායනයක් ආරම්භ කර ඇත. • ප්‍රතිශක්තිකරණ සායනයක් ආරම්භ කර ඇත. **<u>සංයුක්ත සැලැස්ම</u>** මේවන විට සංයුක්ත සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබා ගෙන ඇත. ඒ මත පදනම්ව 2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම ද පිළියෙල කර ඇත.

03.	**<u>අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා විශේෂඥ වෛද්‍යවරුන් පත්වීම.</u>** අධ්‍යක්ෂ මණ්ඩල සහ උපදේශක මණ්ඩලය සඳහා විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළත් වීම සම්බන්ධව කාරක සභාව විසින් ප්‍රශ්න කරන ලදී. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/ විශේෂඥ වෛද්‍යවරයෙකු පවසන ලද්දේ; • සෑම විට නිවැරදි තීරණය මෙන්ම ආයතනයට ලාභදායී සාධාරණ තීරණ ගන්නා බැවින් ද, • ආයතනික ව්‍යුහය පිළිබඳ රෝහල තුල සිටින වෛද්‍යවරුන්ට මනා දැනුමක් ඇති බැවින් ද, • ධනාත්මක තීරණ බොහොමයක් මේ වන විට ක්‍රියාත්මක කර ඇති බැවින්ද, • කාර්ය මණ්ඩලයෙන් ලැබෙන යෝජනා සහ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා ගන්නා බැවින්ද, උපදේශක මණ්ඩලය සඳහා විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළත් වීම සුදුසු බවයි.	අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය සම්බන්ධව කාරක සභාවට දැනුම් දීම.	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්	ප්‍රගතිය වාර්තා කර නොමැත.	රෝහල් මණ්ඩල පනත ප්‍රකාරව ගරු අමාත්‍යතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන අතර පනත සංශෝධනය කිරීම, ඉදිරියේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කැබිනට් මණ්ඩල පත්‍රිකාවෙන් සිදු කෙරේ.
04.	**<u>උපදේශක මණ්ඩලයට විශේෂඥ වෛද්‍යවරුන් පත්වීම.</u>** උපදේශනයට සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනාම උපදේශක මණ්ඩලයට සම්බන්ධ වී තීරණ ගැනීම සහ පසුව එම වෛද්‍යවරුන්ම පහළ තල වලදී එම තීරණ ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වීම, ලබැඳියා ගැටුමක් නිර්මාණය කරන බැවින් ඒ පිළිබඳව කාරක සභාව විසින් අවධානය යොමු කරන ලදි. • තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ 10 දෙනෙකු සිටින බවත්, • බහුතර සාමාජිකයන් ගණන 6ක් විය යුතු බවත්, • අවම වශයෙන් ගන්නා ලද				**<u>උපදේශක මණ්ඩලයට විශේෂඥ වෛද්‍යවරුන් පත් කිරීම</u>** රෝහල් මණ්ඩල පනත ප්‍රකාරව ගරු අමාත්‍යතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන අතර පනත සංශෝධනය කිරීම, ඉදිරියේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කැබිනට් මණ්ඩල පත්‍රිකාවෙන් සිදු කෙරේ.

	තීරණ සම්මත වීම සඳහා උපදේශනයට සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනාගේම තීරණ නිවැරදි නොවුවද ඉතිරි හයදෙනාගේ තීරණ මඟින් යෝජනා සම්මතයකට පැමිණිය හැකි බවත් මෙහිදී කාරක සභාවට අනාවරණය විය.				
05.	**<u>රෝහල නවීකරණය කිරීම සඳහා යෝජනා</u>** මෙම රෝහල් සේවකයන් රජයෙන් වැටුප් ලබන නිසාම පුද්ගලික අංශයේ රෝහලකින් ලබා දෙන සේවාව ලබා නොදෙන බවත්, ජනතාවට පුද්ගලික අංශයේ මෙන් ඉහළ සේවාවක් ලබා දුන් විට මෙම රෝහල වැඩි දියුණු කල හැකි බවත්, කළමනාකරණය සඳහා යම් දැනුමක් සහ හැකියාවක් ඇති කණ්ඩායම් අධ්‍යක්ෂ මණ්ඩලයට සම්බන්ධ කර ගත යුතු බවත්, මෙය ව්‍යාපාරික මට්ටමින් ගොඩනැගිය යුතු බවත්, කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. කාරක සභාව විසින් පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදි. • මෙම ආයතනය සඳහා සංයුක්ත සැලැස්මක් තුල ක්‍රියාකාරී සැලැස්මක් ද අවශ්‍ය බව, • රෝහල් සේවා ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය බව, • සංයුක්ත සැලැස්ම තුල අඩංගු විය යුතු කරුණු ලෙස ව්‍යාපාරික සැලැස්මක්, ප්‍රසම්පාදන සැලැස්මක්, මූල්‍ය සැලැස්මක්, කලමනාකරණ සැලැස්මක් සහ මානව සම්පත් සැලැස්මක්, අවශ්‍ය බව, • මෙම රෝහල ආදර්ශ රෝහලක් කළ යුතු බව,	I. රෝහල නවීකරණය කිරීම සඳහා පවතින බාධා පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම. II. ක්‍රියාකාරී සැලැස්ම ද ඇතුළත්ව සකස් කරන ලද සංයුක්ත සැලැස්ම මාස 2ක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්/ රෝහල් සභාපති	i. නිර්දේශ අංක (i) සඳහා නිර්දේශිත පරිදි, දැනට ව්‍යාපාරික මට්ටමෙන් රෝහල ගොඩනැගීමට පවතින බාධා පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කර ඇත. ii. සංයුක්ත සැලැස්ම කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.	**<u>දැනට ව්‍යාපාරික මට්ටමින් මෙම රෝහල ගොඩනැගීමට පවතින බාධා</u>** I. ව්‍යාපාරික මට්ටමේ පවතින ආයතනයක් බවට පත් වීමට රෝහල් පනත කාලීනව වෙනස් විය යුතුය. II. සෞඛ්‍ය සේවා වෙළඳපල තරඟකාරී ලෙස කටයුතු කිරීමේදී ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දිගු කාලයක් ගත වන බැවින් ව්‍යාපාරික ආයතනයක් ලෙස සැලකීමේදී Organization Agility ඉතාමත් අඩු තත්වයක පවතී. තීරණ ගැනීමේදී දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, චක්‍රලේඛ හරහා යාමට සිදු වී ඇති නිසා කඩිනම් තීරණ ගැනීමේ බලය මෙහෙයුම් මට්ටමෙන් (Operational Level) ලබා දීමේ නොහැකියාවක් පවතී. III. කාර්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී සමාගම් පනත වැනි පනත් තුලින් ආයතන වලට ලබා දී ඇති නම්‍යශීලි භාවය PA සහ PED චක්‍රලේඛ භාවිතා කිරීමේදී නොලැබෙන බැවින් පෞද්ගලික ආයතන සමඟ තරග කිරීමේදී අපහසුතාවයට ලක් වීම. IV. මූල්‍යමය භාවිතයන්හි ක්ෂණික තීරණ ගැනීමේදී පවතින සීමා. V. මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

	• පවතින වටිනා සම්පත් වලින් උපරිම ප්‍රයෝජනයක් ගත යුතු බවත්, • පසුගිය වසර 5ක කාලය තුළ විගණකාධිපති මේ සම්බන්ධයෙන් පෙන්වාදී තිබෙන කරුණු කෙරෙහි කිසිදු සැලකිලිමත්භාවයක් දක්වා නොමැති බව.				**<u>සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, මූල්‍ය සැලැස්ම, මානව සම්පත් සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම</u>** මෙවන විට සංයුක්ත සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබා ගෙන ඇත. ඒ මත පදනම්ව 2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම, මූල්‍ය සැලැස්ම, මානව සම්පත් සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.
06.	**<u>දැක්ම සහ මෙහෙවර</u>** ආයතනයේ දැක්ම වෙත ළඟා වන්නේ කෙසේදැයි කාරක සභාව විමසන ලදුව, ඒ සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව එක්වී මේ වන විට වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඇති බව කාරක සභාවට අනාවරණය විය. මෙම ආයතනයෙහි මෙහෙවර කොපමණ දුරට ඉටුවී තිබේද යන්න පිළිබඳව කාරක සභාව විමසන ලද අතර, රෝහල් අධ්‍යක්ෂ කාරක සභාව හමුවේ පවසන ලද්දේ; • 2020 වසරේ කොරෝනා අර්බුදය නිසා ආයතනය තුළ සැලසුම් අඩාල වූ නමුත්, • ජපන් රජයේ ආධාර යටතේ ආඝාතය, අංශභාගය වැනි රෝගීන් සඳහා රෝහලට පැමිණෙන විගසම රෝහලට ඇතුළත් කර ගැනීමේ පහසුකම් ඇති කිරීම සහ තෘතීක දන්ත ශල්‍ය ඒකකයක් ආරම්භ කිරීමට සැලසුම් සකස් කර ඇති බවයි.				**<u>දැක්ම</u>** 2030 වසර වන විට දකුණු ආසියාවේ විශිෂ්ඨ ප්‍රමුඛතම තෘතීයික සෞඛ්‍ය සත්කාර සපයන්නා බවට පත්වීම. **<u>මෙහෙවර</u>** ''නවීන තාක්ෂණය සමඟින් පිරිවැය ඵලදායී සෞඛ්‍ය සත්කාර විසඳුම් ලබා දීමට කැපවෙමින් විශේෂිත, සුරක්ෂිත, අචාරධර්මානුකූල සහ ගුණාත්මක සම්මතයන් පවත්වා ගැනීමට සහ සෞඛ්‍ය සහ සමසෞඛ්‍ය විද්‍යාවන් පිළිබඳ පූර්ව සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා දීම'' මේ වන විටත් ආඝාතය, අංශභාගය වැනි රෝගීන් රෝහලට ඇතුළත් කර ගන්නා නමුත් Angio CT යන්ත්‍රයක් නොමැති වීමෙන් ක්ෂණිකව ආඝාත තත්වයට ප්‍රතිකාර කිරීමට අපහසු බැවින් ජපන් රජයේ ඍජු පරිත්‍යාගයක් ලෙස ලැබෙන Angio CT යන්ත්‍රය, දන්ත ශල්‍ය ඒකකය සහ අනෙකුත් ශල්‍ය උපකරණ රෝහලට ලැබීමට නියමිත අතර ඉන් කොටසක් 2023 දෙසැම්බර් මස රෝහලට භාර දෙන ලදී.

07.	**<u>කාරක සභාවේ විශේෂ අවධානය යොමු වූ කරුණු</u>** • මෙම රෝහල ලංකාව තුළ පිහිටි වෙනත් රෝහල් සමඟ Benchmark නොකළ යුතු බව , • මෙම රෝහලෙහි වකුගඩු සහ හෘද ශල්‍යාකර්ම සම්බන්ධ වෛද්‍යවරු ඉතාම කැපවීමෙන් වැඩ කරන බව සහ ඉහළ සේවාවක් සපයන බව, • මෙම රෝහල අන්තර්ජාතිකව ප්‍රවර්ධනය කළ යුතු බව සහ අන්තර්ජාතිකව ඉහළට යා යුතු බව, • මෙම රෝහලේ රසායනාගාරය තවදුරටත් ප්‍රවර්ධනය කළ යුතු බව, • රෝහල් පරිශ්‍රයේ පිරිසිදුකම ගැන අවධානය යොමු කළ යුතු බව, • 264 ක් වූ අතිරික්ත කාර්ය මණ්ඩලය බහුතරයක් ප්‍රාථමික කාර්ය මණ්ඩලය බව සහ ඔවුන් විකල්ප වැඩ සටහන් වලට යොදවා ගත යුතු බව සහ • ක්‍රියාකාරී සැලැස්ම තුල මෙම කරුණු අන්තර්ගත විය යුතු බව පිළිබඳව මෙහිදී විශේෂ අවධානය යොමු විය.				**<u>මෙම රෝහල ශ්‍රී ලංකාව තුළ පිහිටි වෙනත් රෝහල් සමඟ Benchmark නොකළ යුතු බව.</u>** සංයුක්ත සැලස්ම සකස් කිරීමේදී මෙම රෝහල Benchmark කරන ලද්දේ, දැනට සිංගප්පූරුව, ඉන්දියාව වැනි කලාපීය රටවල් සමඟය. ඒ අනුව දැනට ප්‍රතිකාර සඳහා සිංගප්පූරුව, ඉන්දියාව වැනි විදේශ රෝහල් වලට ඇදී යන ජනතාව ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට ඇද ගැනීම අභිප්‍රාය වේ. **<u>වකුගඩු සහ හෘද ශල්‍යාකර්ම සම්බන්ධ වෛද්‍යවරු ඉතාම කැපවීමෙන් වැඩ කරන බව සහ ඉහළ සේවාවක් සපයන බව</u>** ඔවුන්ට අදාල සහයෝගය දිගටම ලබා දීමට කටයුතු කරමි. දැනට පුරප්පාඩු වී ඇති විශේෂඥ වෛද්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට අවසරය 2023.04.27 දින ලබා දී ඇත. ඒ අනුව කටයුතු කරමින් පවති. **<u>මෙම රෝහල අන්තර්ජාතිකව ප්‍රවර්ධනය කළ යුතු බව සහ අන්තර්ජාතිකව ඉහළට යා යුතු බව.</u>** ප්‍රතිකාර සඳහා සිංගප්පූරුව, ඉන්දියාව වැනි විදේශ රෝහල් වලට ඇදී යන ජනතාව ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට ඇද ගැනීම අභිප්‍රාය වන අතර මෙම රෝහලට ජාත්‍යන්තර තත්ව සහතික ලබා ගැනීමට ද බලාපොරොත්තු වෙමි. මේ වන විට 2020 ජාතික ඵලදායිතා සම්මාන 03 වෙනි ස්ථානය 2022.04.26 දින ලබා ගෙන ඇති බව සතුටින් සඳහන් කරමි.

					<u>මෙම රෝහලේ රසායනාගාරය තවදුරටත් ප්‍රවර්ධනය කළ යුතු බව.</u> මේ වන විට තොරතුරු තාක්ෂණය භාවිතා කරමින්, • රසායනාගාර පරීක්ෂණ වාර්තා පරිගණකය මඟින් අදාල අංශ තුළදි අවශ්‍ය අයුරින් දර්ශනය කිරීමේ හැකියාව ලබාදී ඇත. • රසායනාගාර වාර්තා අන්තර්ජාලය මඟින් රෝගීන්ට ලබා ගැනීමට හැකියාව ලබාදී ඇත. **<u>රෝහල් පරිශ්‍රයේ පවිත්‍රතාවය.</u>** COPE කමිටුව මඟින් පෙන්වා දුන් අඩුපාඩු සැකසීමේ අරමුණින් ඒ වන විට කන්ටේනර් ටැංකියක අවධිමත් ලෙස පවත්වාගෙන ගිය රෝහලේ නඩත්තු අංශය වෙනත් ස්ථානයක ක්‍රමානුකූල ලෙස ස්ථාපනය කොට ඇත. රෝහල් පරිශ්‍රයේ පවිත්‍රතා කටයුතු මේ වන විට වෙනත් සමාගමකට පවරා ඇත. එම කටයුතු අධීක්ෂණය මහජන සෞඛ්‍ය පරීක්ෂණ මහතුන්, පරිපාලන නිලධාරී, පාලන සහකාර සහ හෙද පාලිකාවන් විසින් සිදු කරනු ලබයි. නියමිත සේවක සංඛ්‍යාව යෙදවීම සහ අදාල කරගත යුතු සේවකයන්ගේ වයස් කාණ්ඩ යනාදිය ටෙන්ඩර් නව සේවා ගිවිසුමේ සඳහන් කර ඇත. **<u>264 ක් වූ අතිරික්ත කාර්ය මණ්ඩලය බහුතරයක් ප්‍රාථමික කාර්ය මණ්ඩලය බවත්, ඔවුන් විකල්ප වැඩ සටහන් වලට යොදවා ගත යුතු බව.</u>** රෝහල් කාර්ය මණ්ඩලයේ වර්තමාන තත්වය පහත පරිදි වේ. රෝහලේ අනුමත මූළු කාර්ය මණ්ඩලය

මේ වන විට 2,049 ක් වන අතර සේවයේ යෙදි සිටින කාර්ය මණ්ඩල 1,690 කි.

ප්‍රාථමික කාර්ය මණ්ඩලය	අනුමත කාර්ය මණ්ඩලය	සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය
ඕඩර්ලි - PL2	436	141
සෞඛ්‍ය කාර්ය සහයක - PL1	51	262
අධීක්ෂණ ඕඩර්ලි	06	02
රියදුරු	14	09
අරක්කැමි	20	09
ත්‍රී විලර් රියදුරු	02	01
දුරකථක ක්‍රියාකරු	08	07
රසායනාගාර ඕඩර්ලි	17	08
වඩු කාර්මික,මේසන්,පින්තාරුකරු,ජලනල කාර්මික,විදුලි කාර්මික, පෑස්සුම්කරණය	25	17
එකතුව	579	456

ඒ අනුව ප්‍රාථමික කාර්ය මණ්ඩලයේ 123 ක හිගයක් පවතින බව පැහැදිලි වේ.

අනෙක් කාර්ය මණ්ඩලය	අනුමත සංඛ්‍යාව	සේවයේ යෙදී සිටින සංඛ්‍යාව
හෙද කාර්ය මණ්ඩලය	650	550
කළමනාකරණ සහකාර - MN1	22	58
කළමනාකරණ සහකාර - MN2	112	45

08.	**<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.</u>** පාලක මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු බව කාරක සභාව හමුවේ අනාවරණය විය. • මණ්ඩලයේ සභාපතිවරයා, • අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, • මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයින්, • රෝහලේ උපදේශක කාර්ය මණ්ඩලයෙන් නම් කරනු ලබන සාමාජිකයන් අතුරින් තිදෙනෙක්, • සිය වෘත්තියෙහි විශිෂ්ට සේවාවක් කර තිබෙන තැනැත්තන් අතුරින් තෝරා ගනු ලබන තැනැත්තන් දෙදෙනෙක් , • නිළ බලයෙන් පත්වී සිටින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා, පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යක්ෂකවරයා සහ රෝහලේ අධ්‍යක්ෂකවරයා, ගණපුරණ සාමාජිකයින් ගණන 05ක් වන අතර පාලක මණ්ඩලය ගණපුරණය පවතිද්දී වුවද විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම අතපසු කර ඇති බව කාරක සභාව හමුවේ දී තවදුරටත් අනාවරණය විය.				**<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.</u>** • 2018.09.26 දින විගණන කමිටු රැස්වීම පැවැත්වීමෙන් පසුව රටෙහි පැවති දේශපාලන වාතාවරණය මත රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලයද රැස්වී නොතිබූ බැවින් විගණන කමිටුව ද රැස්වී නොතිබුණි. • ඉන් පසුව 2019.02.26 දින නැවත නව රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබුනද එහි සාමාජික සංඛ්‍යාව සම්පූර්ණ වී නොතිබූ බැවින් විගණන කමිටුවක් පත් කර නොතිබුණි. • 2019.10.24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී විගණන කමිටුවක් පත් කර තිබූ නමුත් ජනාධිපතිවරණයෙන් පසුව නැවත අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් විය. 2020.02.24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී නැවත විගණන කමිටුවක් පත් කර ඇති අතර 2020.03.20 දින විගණන කමිටුව රැස්වීමට සියලු කටයුතු සූදානම් කර තිබියදී රටේ පැවති Covid-19 හේතුවෙන් එදින විගණන කමිටුව රැස්වීම නොපැවැත්විණි. • 2020.07.28 වන විටද විගණන කමිටුව රැස්වීම පැවැත් වීමට සියලු කටයුතු සූදානම් කර තිබියදී භාණ්ඩාගාර නියෝජිත (විගණන කමිටු සභාපති) අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් නැවතත් විගණන කමිටුව රැස්වීම පැවැත් වීමට නොහැකි විය.

					<u>වර්ථමාන තත්වය</u> • 2022 ඔක්තෝබර් 18 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී නව විගණන කමිටුවක් පත් කර ඇති අතර 2023 වර්ෂයට අදාලව මේ වන විට, විගණන කමිටු රැස්වීම් 05 ක් පවත්වා ඇත. • 2024 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් පැවැත්වෙන දින ද මේ වන විට සැලසුම් කර ඇත.
09.	**<u>ක්‍රියාකාරී සැලැස්ම.</u>** ක්‍රියාකාරී සැලැස්ම තුල වූ ක්‍රියාකාරකම් මෙතෙක් ඉටු නොවීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර මෙහිදී රෝහල් අධ්‍යක්ෂවරයා විසින් ප්‍රකාශ කරන ලද්දේ; • මෙම වර්ෂය සඳහා ප්‍රතිපාදන මෙන්ම ප්‍රාග්ධන වියදම් ද නොලැබුණු බව, • උපයාගන්න අරමුදල් වලින් වැටුප් ගෙවීම් පමණක් සිදු කළ බව, • එම නිසා ඉහත කර්තව්‍යයන් ඉටු කර ගැනීමට නොහැකි වූ බවය.				මෙම ක්‍රියාකාරී සැලැස්ම සකසා තිබුනේ කොවිඩ් අර්බුදයට පෙර වන අතර කොවිඩ් අර්බුදයෙන් පසු රජයෙන් ලබා දෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබා නොදීම, මුදල් අමාත්‍යාංශය මඟින් සියළුම ඉදිකිරීම් නැවැත්වීමට නියෝග ලබාදීම වැනි හේතු මත ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ඉටු කර ගත නොහැකි විය. මේ වන විට රෝහල් ආදායම සුදුසු ලෙස කළමනාකරණය කරමින් රෝහල් කාර්යය මණ්ඩලයේ දායකත්වය ඇතිව අත්‍යාවශ්‍ය නවීකරණ කටයුතු සිදු කරනු ලැබේ. පසුගිය කාලයේ පැවැති කොවිඩ් වසංගත තත්වය හමුවේ කොවිඩ් රසායනාගාරයක්, භාණ්ඩාගාරයේ මුදල් වියදම් කිරීමකින් තොරව ඉදිකර මසකට රුපියල් මිලියන 50 ක පමණ අමතර ආදායමක් උපයමින්, භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල අඩු වූ අවස්ථාවේදී රෝහල Break-even මට්ටමේ පවත්වා ගැනීමට කටයුතු කරන ලද අතර, ඉන්පසු 2022 වසරේ මුහුණ දීමට වූ ඉන්ධන, ආර්ථික හා දේශපාලන අර්බුද හමුවේ ලංකාවේ

					වැඩිම හෘද සැත්කම් ප්‍රමාණයක්, වකුගඩු බද්ධ කිරීම් ප්‍රමාණයක් කිරීමේ ගෞරවය ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට හිමි විය. 2023 වර්ෂයේදී Endoscopy යන්ත්‍රය මිලදී ගැනීම, Laparoscopy යන්ත්‍රය මිලදී ගැනීම, රෝහල් වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම, පරිපාලන ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සිදුකිරීම, රෝගීන්ගේ වෛද්‍ය වාර්තා අන්තර්ජාලය ඔස්සේ ලබාදීම, වැසිකිළි පහසුකම් වැඩිදියුණු කිරීම, රෝහලේ අනෙකුත් නඩත්තු කටයුතු සිදු කිරීම යනාදී කාර්යයන් රැසක් සිදුකර ඇත. එසේම 2024 වර්ෂයේදී ද රෝහල් සේවාව වැඩි දියුණු කිරීම සඳහා කාර්යයන් රැසක් සිදු කිරීමට සැළසුම් කර ඇත. • හදුනාගත් විශේෂිත ප්‍රතිකාර සඳහා නව ඒකක පිහිටුවීම. • ටෙලි වෛද්‍ය ඒකකයක් පිහිටුවීම. • විද්‍යුත් වෛද්‍ය වාර්තා ක්‍රියාත්මක කිරීම. • ජල හා විදුලි සැපයුම් පද්ධති වැඩි දියුණු කිරීම. • නිසි ගිනි ආරක්ෂණ සහ හදුනාගැනීමේ යාන්ත්‍රණය සහතික කිරීම. • කාර්යක්ෂම කසළ කළමනාකරණය සහතික කිරීම. යනාදිය.

10.	**<u>විගණකාධිපතිගේ අවධානය යොමු වූ විශේෂ කරුණු.</u>** විගණකාධිපති විසින් පෙන්වා දුන් පහත සඳහන් විශේෂ කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ කාරක සභාව විමසීම. • මෘදුකාංග වැඩි දියුණු කිරීම සඳහා විශාල මුදලක් ගෙවීම, • Electronic Document Management System සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර පෞද්ගලික සමාගමකට අත්තිකාරම් මුදලක් ලබා දීම, • අතිරික්ත තොග කල් ඉකුත් වීම. කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් තොරව විශාල උපදේශක සේවා ගාස්තුවක් ගෙවීම සම්බන්ධයෙන් ආයතනික අභ්‍යන්තර විගණක සහ අමාත්‍යාංශ විගණක වගකිව යුතු බව කාරක සභාවේ මතය විය.				Electronic Document Management System සඳහා සහ මෘදුකාංග වැඩි දියුණු කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කොට ඇති බව දන්වා සිටිමි. මෙම කරුණු පිළිබඳව පැවති විගණන විමසුම් සම්බන්ධයෙන්, • ජනාධිපති විමර්ෂණ කොමිෂන් සභාව, • FCID, • අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව, • සෞඛ්‍ය අමාත්‍යාංශ විමර්ශන ඒකකය මඟින් පරීක්ෂණ සිදු කෙරුනි. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද මූලික විමර්ෂණයට අදාලව සිදු කරන ලද විධිමත් විනය පරීක්ෂණයේ වාර්තාවට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව අදාල නිළධාරියාට ඉදිරිපත් කල චෝදනා පත්‍රයේ සියළු චෝදනා වලට වැරදිකරු බවට තීරණය කර, විනය නියෝගය ලෙස වැටුප් වර්ධක තුනක් විලම්බනය කිරීමට නියෝග කර ඇත. ඒ අනුව විනය දඬුවම ලෙස අදාල නිළධාරියාගේ වැටුප් වර්ධක තුනක් විලම්බනය කර ඇත. **<u>අතිරික්ත තොග කල් ඉකුත් වීම.</u>** • 2023.01.09 දාතමින් වෛද්‍ය උපකරණ හා ඖෂධ වර්ග ඇණවුම් කිරීම, ගබඩාවේ රඳවා ගැනීම සහ කල් ඉකුත්වීම සම්බන්ධ අදාල නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කර ඇත. මෙහිදී මුදල් රෙගුලාසි

					102(ඇ), 103(ආ), 105(ඇ) අනුව කටයුතු කල යුතු ආකාරයද සඳහන් කර ඇත. • ඊට අමතරව ස්නායු ශල්‍ය ඒකකය සඳහා රු.මි. 4.2 ක් වැය කර මිලදීගෙන තිබුණු ශල්‍ය ද්‍රව්‍ය වලින් 80% භාවිතයෙන් තොරව කල් ඉකුත්වීමට අදාල වගකිව යුතු නිලධාරීන් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් පවත්වනු ලැබූ විශේෂ විගණන පරීක්ෂණයේදී හඳුනාගෙන ඇත. • ශල්‍ය අයිතම කල් ඉකුත්වීම සම්බන්ධයෙන් හානි වාර්තා කිරීම සඳහා "මු.රෙ.104(3) යටතේ අලාභයන් පිළිබඳව ප්‍රාරම්භක වාර්තාව" සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. • මේ වන විට අලාභය තීරණය කර අයකර ගැනීමට අදාල නිර්දේශ ලබා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කර ඇත. ඉදිරියේදී එම කමිටු නිර්දේශ පරිදි කටයුතු කරනු ලැබේ.

11.	**<u>රෝහලට අයත් ඉඩම්.</u>** මෙම රෝහලට අයත් ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සහ මැනුම්පති විසින් කරන ලද ඉඩම් මැනීම නොසලකා හරිමින්, පුද්ගලික මිනින්දෝරුවෙකුට මෙම ඉඩම මැනීම භාර දීමට හේතු කාරක සභාව විමසන ලදී. • මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා ගෙන අවශ්‍ය කටයුතු කරගෙන යන බවත්, • මෙහිදී පර්චස් 165ක් රෝහලට අහිමි වීමේ අවදානමක් පවතින බවත් , • මෙම ඉඩම සඳහා මැනුම්පති සහ පුද්ගලික මිනින්දෝරු විසින් සකස් කරන ලද පිඹුරුපත් 2ක් තිබෙන බවත්, • පුද්ගලික මිනින්දෝරුවරයෙකු විසින් සකස් කරන ලද පිඹුරුපත දැනට ආයතනය සතුව තිබෙන අතර එය නගර සභාවේ අනුමත වී ඇති බවත්, • මැනුම්පති විසින් සකසන ලද පිඹුරුපත නගර සභාවේ අනුමත කර නොමැති බවත්, • මෙම ඉඩමේ අනවසර ඉදිකිරීමක් පවතින බව නිරීක්ෂණය වූ බවත්, • මෙම කරුණු සම්බන්ධව 2021.10.25 වැනි දින නීතිපතිගෙන් උපදෙස් ඉල්ලා ඇති බවත්, • ඒ සඳහා නීතිපති විසින් 2021.11.10 වන දින උපදෙස් ලබා දී ඇති බවත්, කාරක සභාවට අනාවරණය විය. මේ සම්බන්ධයෙන් කාරක සභාව පහත කරුණු විමසන ලදී. • මෙම ඉඩම සඳහා මැනුම්පති පිඹුරුපත	i. රෝහලට අයත් ඉඩම් මැනීම සඳහා පුද්ගලික මිනින්දෝරුවරයෙකුගේ සහාය ලබා ගැනීමට හේතු සහ එය නගර සභාවේ අනුමත කිරීමට හේතු . ii. මේ සම්බන්ධයෙන් වැරදි තීන්දු තීරණ ගත් සියළුම නිලධාරීන්ගේ නම් ලැයිස්තුව, (කලින් සිටි නීති නිලධාරීන්ගේ නම් ද ඇතුළත්ව) මේ වන විට ඔවුන්ගේ සේවා ස්ථාන වල විස්තර සහ අනවසර ඉඩම් අත්පත් කර ගැනීමේදී නඩු පවරා තිබේද යන්න ඇතුලත්ව සකස් කරන ලද සංක්ෂිප්ත වාර්තාවක් අමාත්‍යාංශ ලේකම් මහින් කාරක සභාවට ඉදිරිපත් කිරීම.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්/ රෝහල් සභාපති	i. පුද්ගලික මිනින්දෝරුවෙකු ලවා ඉඩම මැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නොමැති අතර හිටපු අධ්‍යක්ෂවරයකුගේ අනුමැතිය ඇති බවත්, මෙම ඉඩමේ අනවසරයෙන් අල්ලාගෙන ඇති රෝහලට අයිති කොටස රජයට පවරා ගැනීමට නීතිපතින් මගින් නඩු පැවරීමට 2022.12.09 දින කටයුතු කර ඇති බවත් කාරක සභාව වෙත වාර්තා කර ඇත. ii. ඉඩම සම්බන්ධ තීරණ ගත් නිලධාරීන්ගේ නාම ලේඛනය කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.	**<u>වත්මන් තත්වය</u>** • සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අනුරේඛන අංක CO/MMR/2014/722 ප්‍රකාරව ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් භූමියේ අනවසර පදිංචිකරුවන් භුක්ති විඳින ඉඩම් කොටස් නැවත ලබා ගැනීම සඳහා 1979 අංක 7 දරණ රජයේ ඉඩම් (සන්තකය) ආපසු ලබා ගැනීමේ පනත යටතේ නෙරපීම සඳහා සකස් කරන ලද අස් කිරීමේ දැන්වීම, ඒ ඒ LOT වලට අදාල පැමිණිලි හා දිවුරුම් පත්‍රය යන ලේඛන සියල්ල අනුමැතිය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා දී ඇත්තේ උක්ත පනත යටතේ නඩු පැවරීමට ප්‍රථම රෝහල් භූමිය නිසි පරිදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය වෙත පවරා දී ඇති දැයි ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් තහවුරු කර ගත යුතු බවය. ඒ අනුව අදාල තහවුරුව ලබා ගැනීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත 2023.07.13 දින ලිපියක් යවා දැනුම් දී ඇත. • ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් භූමිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරා දීමේදී අනුගමනය කළ යුතු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කර නොමැති බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් 2023.07.28 දින දරන ලිපියෙන් දැනුම් දී ඇත. • ඒ අනුව ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු

	සකස් කලද නැවතත්, පුද්ගලික මිනින්දෝරුවෙක් මහින් පිඹුරුපත සකස් කිරීමට හේතු සහ • පුද්ගලික මිනින්දෝරුවෙක් ලවා ඉඩම මැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් තිබේද, සහ එය නගර සභාවේ අනුමත කිරීමට හේතු,				වන නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සම්බන්ධයෙන් 2023.09.14 දින සාකච්ඡාවක් පවත්වා ඇත. අනවසර පදිංචිකරුවන් හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව ස්ථානීය පරීක්ෂණය සිදුකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් මේ වනවිට කටයුතු සිදු කරමින් පවතී.
12.	**<u>රෝහල සතුව ඇති දත්ත.</u>** 2016 වසරේ කාර්ය සාධන වාර්තාව අනුව 2016 සිට 2021 වන විට රෝහලට ඇතුලත් වූ රෝගීන් සංඛ්‍යාව 59,000 සිට 31,000 දක්වා අඩු වූ බවත්, ශෛල්‍යකර්ම අඩු වී ඇති නමුත් 2022 වර්ෂය වන විට ලාභය වැඩි වී ඇති බවත් නිරීක්ෂණය කළ කාරක සභාව මේ සඳහා හේතු විමසන ලදී. මෙහිදී රෝහලේ ගණකාධිකාරී විසින් අදහස් දක්වමින් සඳහන් කරන ලද්දේ, • 2020 වර්ෂයේ ආදායම රු.මිලියන 2353ක් බවත්, 2021 වර්ෂයේ ආදායම රු. මිලියන 2814ක් බවත්, 2022 වර්ෂයේ ඔක්තෝබර් මස වන විට රු. මිලියන 2688 වූ බවත්ය. මෙසේ ආයතනයේ ආදායම වැඩි වීමට හේතු දක්වමින් රෝහලේ ගණකාධිකාරී විසින් පවසන ලද්දේ; • මෙම රෝහල ආරම්භයේ සිටම සේවා සපයන ආයතනයක් ලෙස දිගටම පවත්වාගෙන ගිය බවත්, • නමුත් මේ වසරේ මිල සූත්‍රයක් හඳුන්වා දුන් බවත්,	i. මෙම රෝහලෙන් අපේක්ෂිත ගුණාත්මක සේවාවක් ඉටු නොවීම විශාල ගැටළුවක් බැවින්, මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම. ii. රජයේ රෝහලකින් බලාපොරොත්තු වන සහන මෙම රෝහලෙන් ඉටු නොවන අතර ජනතාව මෙම රෝහලෙන් ලබා ගන්නා සේවාව අවම වන බැවින්, මෙම කාරණා දෙකම සමබරව පවත්වා ගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්/ රෝහල් සභාපති	ප්‍රගතිය වාර්තා කර නොමැත.	**<u>රෝහල් සේවා ප්‍රවර්ධනය කිරීම</u>** රෝහල් සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා සහ රජයේ විශේෂිත රෝහලක් ලෙස බලාපොරොත්තු වන සහන ලබා දීම සඳහා අවශ්‍ය පියවර රැසක් මේ වන විට ගෙන ඇත. • සමාජ මාධ්‍ය උපයෝගී කර ගනිමින් රෝහල විසින් සපයනු ලබන සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් මේ වන විට ආරම්භ කර ඇත. • ප්‍රතිකාර ගෙන රෝහලින් බැහැර යන රෝගීන් සඳහා නියම කෙරෙන බෙහෙත් ලබා දීම ආරම්භ කර ඇත. • දන්ත වෛද්‍ය ඒකකයක් ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී. • ස්නායු රෝග සහ ආඝාතය කල්තියා හඳුනා ගත හැකි විශේෂ ඒකකයක් පිහිටුවීමට කටයුතු කරමින් පවතී. • රෝහලට පැමිණෙන රෝගීන් හා අමුත්තන් පිළිගෙන අවශ්‍ය අංශ වෙත යොමු කිරීම සඳහා රෝහල් කාර්යය මණ්ඩලයේ සාමාජිකාවන් තිදෙනෙකු පුහුණු කොට වඩාත්

	• සමතුලිත ලක්ෂය (Break-even point- ලාභ අලාභ නොලබන තත්වය) තුළ මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී රෝහල පවත්වාගෙන යා යුත්තේ කෙසේද යන පදනම මත එම මිල සූත්‍රය හඳුන්වා දුන් බවත්, • ඒ අනුව 30%ක රෝහල් ගාස්තු වැඩි කළ බවත්, මාස තුනෙන් තුනට සමාලෝචනය කර නැවත ගාස්තු 15%කින් වැඩි කරන බවත්ය.				ගුණාත්මක සේවාවක් ලබා දී ඇත. • රෝගීන්ගේ පරීක්ෂණ වාර්තා මාර්ග ගත ක්‍රමයට ඔවුන් වෙත යැවීම ආරම්භ කර ඇත. • වැසිකිලි පද්ධතියේ නවීකරණ කටයුතු සිදු කර ඇත. • රෝහල් පරීක්ෂණ හා ශල්‍යාකර්ම වලට අදාල මිල ගණන් තොරතුරු රෝහල් වෙබ් අඩවිය මඟින් ලබා දීම ආරම්භ කර ඇත. • හදිසි ප්‍රතිකාර සඳහා කායික විශේෂඥ වෛද්‍යවරයෙක් (Emergency Physician) බඳවා ගෙන හදිසි ප්‍රතිකාර ඒකකය (ETU) වැඩි දියුණු කර ඇත. • නිවසේ සිටින රෝගියා වෙතට ගොස් ප්‍රතිකාර ලබාදීමේ Pre Hospital Care සේවාව ආරම්භ කිරීම සඳහා සැළසුම් කර ඇත. • Pain Management සායනය, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා සායනය,ප්‍රතිශක්තිකරණ සායනය ආරම්භ කර ඇත. • වර්තමානයේ කුඩා කාමරයක පවත්වාගෙන යන බාහිර රෝගී අංශය(OPD), හැටන් නැෂනල් බැංකුව වෙත කුළියට ලබා දී තිබූ ගොඩනැගිල්ලට ගෙන ගොස් අංග සම්පූර්ණ බාහිර රෝගී අංශයක් (OPD) ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ එක්ව කටයුතු කරමින් සිටී. • ජපන් රජයේ සහයෝගය යටතේ සූයී බල පද්ධතියක් ඉදි කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. • සහතික ලත් NVQ 3 සහ NVQ 4 සාත්තු සේවා සහ හෙද පුහුණු සපයන ආයතනයක් ආරම්භ කොට

ඇත (Training Arm).

- රෝහලේ රෝගීන් බැලීමේ වේලාව වැඩි කිරීමට කටයුතු කර ඇත.

	උදේ	දවල්	සවස
පෙර	-	12.00-1.00	5.00-6.00
වර්තමානයේ	6.00-7.00	12.00-1.00	4.30-6.30

- ඊට අමතරව සාමාන්‍ය වාට්ටුවක එක් රෝගියෙකු බැලීම සඳහා නිකුත් කරනු ලබන අවසර පත් සංඛ්‍යාව 02 සිට 03 දක්වා වැඩි කර ඇත.
- අය කරන ගාස්තු නිතර ඉහළ නොදැමීමට හා පුද්ගලික රෝහල් විසින් අය කරන ගාස්තුවට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කර ඇත.

පහත සඳහන් දත්ත අනුව රෝහලේ විවිධ අංශයන්හි සැළකිය යුතු වර්ධනයක් පෙන්වයි.

(සංඛ්‍යා දහස් වලින්)

	2020	**2021**	**2022**	**2023**
Admissions	45.9	39.9	42.6	49.9
Clinic Visits	138	136	153	170
OPD Visits	16.3	13.3	19.5	25.3
ETU Visits	28.6	25.7	33.3	35.8
Surgeries	11.8	10.5	12.4	13.1

13.	**<u>කාර්ය මණ්ඩලය</u>** කාර්ය මණ්ඩලයේ යම් යම් තනතුරුවල ඌණතා මෙන්ම සමහර තනතුරු වල අතිරික්ත කාර්ය මණ්ඩලයක් පැවතීමට හේතු කාරක සභාව විසින් විමසන ලදී. • විධායක ශ්‍රේණි වල අතිරික්තයක් පවතින අතර, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ නීති නිලධාරී තනතුරු දෙකම එක් නිලධාරියෙකු දරන බවත්, • මෙම තනතුරු දෙකම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන නොමැති බවත්, • බඳවා ගැනීමේ පටිපාටියේ විශාල ගැටළුවක් පවතින බවත් , • 2020 වර්ෂයේ දී බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීම සඳහා උපදේශකවරයෙකුට රු.760,000/- ක් ගෙවා ඇති බවත් , • බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර ආයතනය වෙත නියමිත කාලය තුළ භාර නොදුන් බැවින් නැවත එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම් දී තිබෙන බවත්, • බඳවා ගැනීමේ පටිපාටියේ පැරණි කෙටුම්පත නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත්, කාරක සභාවයට අනාවරණය විය.	i. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පසුගාමී බැවින්, ඒ පිළිබඳ කාරක සභාවට හේතු දැක්වීම.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්/ රෝහල් සභාපති	නිර්දේශ අංක (i) ට අදාලව පැහැදිලි කිරීම් කාරක සභාවට වෙත ඉදිරිපත් කර ඇත.	**<u>කාර්ය මණ්ඩලය</u>** අතීතයේ සිට පැවති විවිධ රජයන් රෝහල් අවශ්‍යතාවයන්ට ගැලපීම සම්බන්ධව නොසලකා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කර තිබීම හේතුවෙන් ඇතැම් තනතුරුවල කාර්ය මණ්ඩල අවශ්‍යතාවයට නොගැලපීම් වන අයුරින් ඇතුලත් කර තිබීම හේතුවෙන් ප්‍රශස්ථ සේවාව ලබා දීමේ අපහසුතාවයක් පවතින බැවින් එම තත්වය නිවැරදි කිරීමට කටයුතු සංවිධානය කොට ඇත. එමෙන්ම වර්තමානයේ අනුමත කාර්‍ය මණ්ඩල වලට සාපේක්ෂව සේවයේ නියුතු කාර්‍ය මණ්ඩලයේ හිඟයක් පවතී. **<u>විධායක ශ්‍රේණි වල අතිරික්තයක් පවතින බව.</u>** ප්‍රධාන විධායක ශ්‍රේණිය වන විශේෂඥවෛද්‍යවරුන් ගේ අතිරික්තයක් නොමැත. සායනික සේවාව නිසි ආකාරව පවත්වා ගැනීම සඳහා වෛද්‍ය කාර්‍යමණ්ඩල අත්‍යවශ්‍ය අවස්ථාවලදි හැර බඳවා ගැනීම් සිදු කොට නොමැත. **<u>අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ නීති නිලධාරී තනතුරු දෙකම එක් නිලධාරියෙකු දරන බව සහ මෙම තනතුරු දෙකම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගෙන නොමැති බව</u>** • අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ට අදාළ බොහෝ කරුණු වලදී නීතිමය ගැටලු හා සම්බන්ධ කරුණු පවතී. එසේම අධ්‍යක්ෂ මණ්ඩලය නිතරම තීරණ ගත යුත්තේ නීතිමය පදනමකිනි. එබැවින් විශාල කාර්යභාරයක් නීති නිලධාරී විසින්

					සිදු කරනු ලබයි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් නීති නිලධාරී වීමේ විශේෂ වාසි පවතී. • තනතුරු දෙකම සඳහා ස්ථීර පදනමකින් 2019 දී නිලධාරිනියක බඳවා ගෙන ඇති අතර මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හා නීතී නිලධාරී තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගෙන ඇත. **<u>බඳවා ගැනීමේ පටිපාටියේ විශාල ගැටළුවක් පවතින බව.</u>** නිවැරදි වැටුප් කේත සහ පරිමාණ සකස් කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. බඳවා ගැනීමේ පටිපාටිද සකස් කර ඇති අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. **<u>2020 බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීම සඳහා උපදේශකවරයෙකුට රු.760,000/- ක් ගෙවා ඇති බව.</u>** • රෝහලට නිසි බඳවා ගැනීම් පටිපාටියක් නොමැති වීම නිසා ඇති වූ ගැටලු නිරාකරණය කිරීමේ අරමුණින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මාස හයකට වඩා අඩු බැවින් Selection on Consultant's Qualification (CQS) යටතේ මෙම තෝරා ගැනීම සිදු කර ඇත. නමුත් එය ඉටු කිරීමට මාස 06 ඉක්මවා ඇත. • මේ වන වට රෝහල මගින් සකස්

					කර අනුමැතියට යවා ඇති බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සඳහා එම උපදේශකවරයා ලබාදී ඇති කෙටුම්පත් බඳවා ගැනීම් පටිපාටි සහ රැකියා විස්තර උපයෝගී කරගෙන ඇත. ඒ අනුව ඔහු වෙත ගෙවා ඇති මුදල නිෂ්කාර්ය වියදමක් නොවේ. **<u>අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පසුගාමී බැවින්, ඒ පිළිබඳ කාරක සභාවට හේතු දැක්වීම.</u>** අතීතයේදී ගත් සමහර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ දෝෂ සහිත බව හඳුනාගෙන ඇත. 1. මෙහෙයුම් මට්ටමේ (Operational Level) තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේදී ගැනීම නිසා එම තීරණ පසුකාලීනව ව්‍යාකූල වීම. 2. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගැනීමට පෙර එම තීරණයේ හිතකර සහ අහිතක ප්‍රතිඵල සැලකීමකට නොගැනීම. මෙම තත්වය අවම කිරීම සඳහා, 01. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමේදී: • ගනු ලබන තීරණයේ අහිතකර ප්‍රතිපල වල ප්‍රමාණය සහ සම්භාවිතාවය (Risk Analysis for Size and Likelihood of the Impact of the recommendation) • නිර්දේශයේ මූල්‍යමය ඵලදායිතාවය (Cost benefit Analysis of the recommendation) • නිර්දේශ කරන පුද්ගලයා ඊට වගවිය යුතු වන ලෙස

					(Responsibility and the accountability of the impact of recommendation.) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අකෘතිය වෙනස් කිරීමට කටයුතු කර ඇත. 02. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සංඛ්‍යාව අඩු කර ඇත.
	<u>රෝහල සම්බන්ධයෙන් 2017.06.09 දින කාරක සභාවේ දී ලබා දුන් නිර්දේශ පිළිබඳ වර්තමාන තත්ත්වය.</u>				
14.	**<u>නියෝග අංක 07 - අභ්‍යන්තර විගණක සේවයෙන් පහ කිරීම.</u>** 2017.06.09 දින කාරක සභාවේ දී තීරණය වූ පරිදි රෝහලේ අභ්‍යන්තර විගණක සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණයක් නිසා ඔහු විසින් ආයතනයට නඩු පවරා ඇති බවත්, එම නඩුවෙන් අභ්‍යන්තර විගණක හට ආයතනය විසින් දඩ මුදලක් ගෙවීමට සිදු වූ බවත් කාරක සභාවට අනාවරණය විය.				මෙම නඩුව කොළඹ මහාධිකරණයේ අභියාචන විභාගයට භාජනය කර 2020.05.28 වන දින තීන්දුව ලබා දී ඇත. ඒ අනුව හිටපු අභ්‍යන්තර විගණක එච්.ඩී.එල්.සී. කරුණාරත්න යන අය අනිවාර්ය විශ්‍රාම ගැන්වීම අසාධාරණ හා අයුක්ති සහගත බව මහාධිකරණ නඩු තීන්දුවේ දක්වා ඇත. මෙම නඩු තීන්දුව පරිදි ඔහු සාමාන්‍ය පරිදි විශ්‍රාම ගියා සේ සැලකීමට අධිකරණය කටයුතු කර ඇත. එබැවින් මෙම නඩුව අභියාචනා කිරීමේදී තැන්පත් කර තිබූ මුදල රු. 2,992,430/- ක මුදල අධිකරණය මඟින් එච්.ඩී.එල්.සී.කරුණාරත්න මහතා වෙත මුදාහැරීමට කටයුතු කර ඇත. ඔහුට ගෙවිය යුතු පාරිතෝෂික මුදල් හා අධිභාරය රු.791,739.00 බවට මහරගම සහකාර කම්කරු කොමසාරිස් විසින් ගණනය කර ඇත. ඒ අනුව නොගෙවන ලද පාරිතෝෂික මුදල අය කර ගැනීම සඳහා පාරිතෝෂික පනත ප්‍රකාරව නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ 27274 අංක දරණ නඩුව ගොනු කර ඇත. එම මුදල ගෙවීම සඳහා 2020.09.24 දින පැවති 443 වන

					අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීමට කටයුතු කර ඇත. මෙවැනි අවිධිමත් සේවයෙන් පහ කිරීම් ඉදිරියේදී ඇති නොවීමට කටයුතු කරමි.
15.	**<u>නියෝග අංක 14 - කල් ඉකුත් වූ තොග</u>** ස්නායු ශල්‍ය ඒකකය සඳහා රු. මිලියන 4.12ක් වැය කර මිලදී ගෙන තිබුණු ශල්‍ය ද්‍රව්‍ය වලින් 80%ක් භාවිතයෙන් තොරව කල් ඉකුත් වීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාවට එවීමට කටයුතු කරන ලෙස නිර්දේශ කර තිබු නමුත් මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම පිළිබඳ කාරක සභාව විමසන ලදී.	i. උක්ත කරුණ සම්බන්ධව ගනු ලබන තීරණ පිළිබඳ ප්‍රගතිය සති දෙකක් ඇතුළත කාරක සභාවට වාර්තා කිරීම.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්/ රෝහල් සභාපති	ප්‍රගතිය වාර්තා කර ඇත.	**<u>කල් ඉකුත් වූ තොග.</u>** • 2023.01.09 දාතමින් වෛද්‍ය උපකරණ හා ඖෂධ වර්ග ඇණවුම් කිරීම, ගබඩාවේ රදවා ගැනීම සහ කල් ඉකුත්වීම සම්බන්ධ අදාල නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කර ඇත. මෙහිදී මුදල් රෙගුලාසි 102(ඇ), 103(ආ), 105(ඈ) අනුව කටයුතු කල යුතු ආකාරයද සඳහන් කර ඇත. • ඊට අමතරව ස්නායු ශල්‍ය ඒකකය සඳහා රු.මි. 4.2 ක් වැය කර මිලදීගෙන තිබුණු ශල්‍ය ද්‍රව්‍ය වලින් 80% භාවිතයෙන් තොරව කල් ඉකුත්වීමට අදාල වගකිව යුතු නිලධාරීන් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් පවත්වනු ලැබූ විශේෂ විගණන පරීක්ෂණයේදී හඳුනාගෙන ඇත. • ශල්‍ය අයිතම කල් ඉකුත්වීම සම්බන්ධයෙන් හානි වාර්තා කිරීම සඳහා "මු.රෙ.104(3) යටතේ අලාභයන් පිළිබඳව ප්‍රාරම්භක වාර්තාව" සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. • මේ වන විට අලාභය තීරණය කර අයකර ගැනීමට අදාල නිර්දේශ ලබා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කර ඇත. ඉදිරියේදී එම කමිටු නිර්දේශ පරිදි කටයුතු කරනු ලැබේ.

16.	**<u>නියෝග අංක 20 - රෝහල් පරිශ්‍රය තුල ඇති විය හැකි ගින්නක් නිවා දැමීමේ හැකියාව තක්සේරු කිරීම.</u>** මේ පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳව රෝහලේ සැලසුම් අංශය භාර වෛද්‍ය නිලධාරිනිය විසින් ප්‍රකාශ කරන ලද්දේ; • ඉතාමත් හොඳ ගිනි ආරක්ෂණ පද්ධතියක් රෝහල් තුළ තිබූ බව, • නමුත් නිසියාකාරව එම උපකරණ නඩත්තු වීමක් සිදු වී නොමැති බව, • මුලින් තිබූ ගිනි ආරක්ෂණ පද්ධතිය දැනට ක්‍රියාත්මක නොවන බව, • දැනට පවතින ගිනි ආරක්ෂණ පද්ධතිය යථා තත්ත්වයට පත් කිරීමට හැකියාවක් නොමැති බව, • ඒ පිළිබඳව අප්‍රමාදව ගත යුතු ක්‍රියාමාර්ග ලෙස මධ්‍යගත පද්ධතියට (centralized system) අමතරව ගිනි නිවීමේ උපකරණ (fire extinguishes) අවශ්‍ය තැන්වල තබා ඇති බව, • සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ ඒකකයට ඒ පිළිබඳ දැනුම් දී ඇති බව සහ • ඒ සඳහා අවශ්‍ය වෛද්‍ය නිලධාරීවරයෙක් සහ යම් මුදල් ප්‍රමාණයක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දුන් බවත්ය. කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව යටතේ මේ සියලු ආයතන වසරකට වරක් තක්සේරු කළ යුතු බැවින් එම තක්සේරුව මෙම ආයතනය සිදු කරන ලද්දේද යන්න පිළිබඳවත්, නිසි ප්‍රමිතියට අවශ්‍ය දේ සිදු නොවීමට හේතු පිළිබඳවත් කාරක සභාව විසින් විමසන ලදී.				**<u>රෝහල් පරිශ්‍රය තුල ඇති විය හැකි ගින්නක් නිවා දැමීමේ හැකියාව තක්සේරු කිරීම.</u>** • ඉතාමත් හොඳ ගිනි ආරක්ෂක පද්ධතියක් ජපන් ඉදිකිරීමේදී රෝහල තුළ තිබූ නමුත් එයට අවුරුදු 39ක් ගත වීම හේතුවෙන් යම් යම් දෝෂ වලට ලක් වී ඇත. • වර්තමානයේ පවතින මූලධන පහසුකම්වල දුෂ්කරතා හේතුවෙන් රෝහලේ නඩත්තු අංශය සම්බන්ධ වී රෝහල් ගිනි ආරක්ෂක පද්ධතිය නවීකරණය කරමින් පවති. • සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ ඒකකය සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාවේ ගිනි නිවන දෙපාර්තමේන්තුව එක්ව ආපදා කළමනාකරණ සහ ගිනි ආරක්ෂක සැලැස්මක් සකස් කර ඇත. (සකස් කර ඇති ගිනි ආරක්ෂක සැලැස්මේ පිටපතක් මීට පෙර වාර්තා සමග ඉදිරිපත් කර ඇත.) • මේ වන විට ගිනි රක්ෂණයක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ඔවුන් විසින් රෝහලේ රක්ෂණයට යටත් වන විෂය පථය විමසා ඇති අතර ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද යොමු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මේ වන විට කටයුතු කරමින් පවතී. • මේ වන විට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නිළධාරීන් පැමිණ රෝහල් කළමනාකරණය සමග සාකච්ඡා කර අදාල තොරතුරු ලබා

					ගනිමින් පවතී. • ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාවේ ගිනි නිවන දෙපාර්තමේන්තුව එක්ව ඇස්තමේන්තු සකස් කර දැනට ප්‍රතිසංස්කරණය කළ යුතුව ඇති ගිනි ආරක්ෂක පද්ධතිය නොපමාව ප්‍රතිසංස්කරණය කිරීමටත්, ඒ අනුව ගිනි රක්ෂණයක් ලබා ගැනීමටත් 2023 දෙසැම්බර් මස පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය වී ඇත.
17.	**<u>නියෝග අංක 24</u>** **<u>සූර්ය බලශක්තිය නිපදවීමේ ව්‍යාපෘතිය</u>** මෙම ව්‍යාපෘතිය ආරම්භ කර උපදේශන ගාස්තු වශයෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) ආයතනයට රු.මි. 2.97 ක් ගෙවා තිබෙන අතර ඒ පිළිබඳ වර්තමාන තත්ත්වය විමසූ කාරක සභාවට රෝහලේ අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලද්දේ ; • රු.මිලියන 2.97 ක මුදලක් CECB වෙත ගෙවා තිබූ නමුත් මේ වන විට ජයිකා ආයතනය සමඟ සම්බන්ධ වී ඒ පිළිබඳ සාකච්ඡා කරමින් සිටින බවත්, • මේ සඳහා ජපානයෙන් පිරිසක් මෙරටට පැමිණි බවත්, • මෙම ව්‍යාපෘතිය පිළිබඳ පසු ගිය තොරතුරු සියල්ල JICA ආයතනය වෙත ලබා දුන් බවත්, • ලබා දුන් තොරතුරු, JICA ආයතනය මඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා උපයෝගී කර ගනු ඇතැයි ඔහු විශ්වාස කරන බවත්ය.				**<u>සූර්ය බලශක්තිය නිපදවීමේ ව්‍යාපෘතිය</u>** • රෝහල තුල සූර්ය බලශක්තිය නිපදවීමේ ක්‍රියාවලිය 2018/2019 යන වර්ෂවලදී මූලික වියදම් දරා ආරම්භ කර ඇති නමුත් කොවිඩ් අර්බුදයේදී රජය විසින් ප්‍රාග්ධන වියදම් නැවැත්වීම හේතුවෙන් එය අතරමගදී නතර කිරීමට සිදු විය. • මේ වන විට JICA ආයතනය පරිත්‍යාගයක් ලෙස රෝහල් වහල මත ඉදි කරන සූර්ය බලශක්ති නිෂ්පාදන ව්‍යාපෘතියේ මූලික කටයුතු ජපන් තාක්ෂණික කණ්ඩායමක් පැමිණ ආරම්භ කොට ඇත. • එහිදී CECB ආයතනයේ කරන ලද ඇගයීම් JICA ආයතනයට භාර දී ඇත. • 2023.04.17 වන දින ලංකාවට පැමිණි JICA ආයතනයේ කණ්ඩායම සෞඛ්‍ය අමාත්‍යාංශය සමගත් ශ්‍රී ජයවර්ධනපුර රෝහල සමගත් කටයුතු කරමින් සූර්ය බලශක්ති නිෂ්පාදන ව්‍යාපෘතියේ මූලික සැලැස්ම සැකසීමට කටයුතු කෙරුණි.

					• වර්තමානයේදී මෙම සූර්ය බලශක්තිය නිපදවීමේ ක්‍රියාවලිය සඳහා ජපානයේ JICA සමාගම හා සෞඛ්‍ය ලේකම් විසින් අත්සන් කර ඇත. මෙය ජයවර්ධනපුර මහ රෝහල, රත්නපුර මහ රෝහල හා කුරුණෑගල මහ රෝහල යන රෝහල් සඳහා ක්‍රියාත්මක කිරීමට ඔවුන් බලාපොරොත්තු වේ. • මේ වන විට JICA ආයතනය විසින් සමාගමක් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇති අතර එහි වාර්තාව ජපානයට සහ සෞඛ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.
18.	**<u>විද්‍යුත් ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් සැකසීම.</u>** **<u>(Electronic Document Management System)</u>** අධ්‍යක්ෂ මණ්ඩල සඳහා විද්‍යුත් ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් සැකසීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා කාර්යය මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුගේ භාර්යාව අධ්‍යක්ෂකවරියකව සිටි සමාගමක් වෙත 2015 නොවැම්බර් මස 26වැනි දින ප්‍රදානය කර තිබූ අතර, මෙම සමාගම 2015 ඔක්තෝබර් 8වැනි දින ලියාපදිංචි කර තිබුණු සමාගමක් බව කාරක සභාවට අනාවරණය විය. පරිගණක මෘදුකාංගය සඳහා රු.මිලියන 1.8ක් ද, ලේඛන scanning සහ uploading සඳහා 2019 දෙසැම්බර් 31 වැනි දින වන විට රු. මිලියන 19.7ක්ද වැය කර තිබූ බව තවදුරටත් අනාවරණය වූ අතර, මේ සම්බන්ධව ලබැදියාවන්ගේ ගැටුමක් පවතින බවත් ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳවත් කාරක සභාව විමසා සිටින ලදි.	i. විධිමත් විනය පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීම. ii. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට මෙතෙක් ප්‍රමාදවීමට හේතු පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සතියක් තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම. iii. මෙම කරුණු සම්බන්ධයෙන් ද ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් සතියක් ඇතුළත කාරක සභාවට වාර්තා කිරීම.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්/ රෝහල් සභාපති	මූලික විමර්ශන වාර්තා කඩිනම් කරමින් රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමට නීතිපති වෙත යොමු කර ඇති බවත්, විධිමත් විනය පරීක්ෂණ වාර්තාව ලද පසු ඒ අනුව ආයතනිකව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවත් කාරක සභාව වෙත වාර්තා කර ඇත.	**<u>විද්‍යුත් ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් සැකසීම.</u>** **<u>Electronic Document Management System</u>** මේ සම්බන්ධයෙන්, • ජනාධිපති විමර්ෂණ කොමිෂන් සභාව • FCID • අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව • සෞඛ්‍ය අමාත්‍යාංශ විමර්ශන ඒකකය මඟින් පරීක්ෂණ සිදු කෙරුණි. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද මූලික විමර්ෂණයට අදාලව සිදු කරන ලද විධිමත් විනය පරීක්ෂණයේ වාර්තාවට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව අදාල නිළධාරියාට ඉදිරිපත් කල චෝදනා පත්‍රයේ සියළු චෝදනා වලට වැරදි කරු බවට තීරණය කර විනය නියෝගය ලෙස වැටුප් වර්ධක තුනක් විලම්බනය

	මේ සම්බන්ධව රෝහලේ නීති නිලධාරී පවසන ලද්දේ; • මූලික විමර්ශන වාර්තාව ලැබුණේ මීට දින 2ට පෙර වන අතර, ඒ සඳහා විධිමත් විනය පරීක්ෂණයක් සිදු කරමින් පවතින බවත්,අමාත්‍යාංශයේ මූලික විමර්ශන වාර්තාව අනුව වගකිව යුතු පුද්ගලයින් සඳහා නඩු පැවරීමේ හැකියාව පිළිබඳ නීති උපදෙස් ඉල්ලා ඇති බවත්, • මූලික විමර්ශන වාර්තාව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් රෝහල වෙත යොමු කර ඇත්තේ 2019.08.06 වැනි දින බවත්, එය රෝහල වෙත ලැබුණේ මීට දින 2 ට පෙර ඒ පිළිබඳ විමසීමේ දී බවත්, • මෙම ආයතනයේ ලේඛන සැඟවීමක් හෝ ලිපි ලේඛන අස්ථානගත වීමක් පිළිබඳ ගැටළුවක් පවතින බවත්ය. මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග සහ විධිමත් විනය පරීක්ෂණය මෙතෙක් ප්‍රමාද වීමට හේතු කාරක සභාව විසින් විමසන ලදි.				කිරීමට නියෝග කර ඇත. ඒ අනුව විනය දඩුවම ලෙස අදාල නිළධාරියාගේ වැටුප් වර්ධක තුනක් විලම්බනය කර ඇත.
19.	**<u>පරිපාලන නිලධාරී තනතුර</u>** පරිපාලන නිලධාරී තනතුරට අදාළ සියළුම ලිපි ලේඛන පරිපාලන නිලධාරී තනතුරේ වැඩ භාරගත් නිලධාරිනියට භාර නොදුන් බව එම නිලධාරිනිය විසින් කාරක සභාව හමුවේ පැවසුවාය. එහෙත් රෝහල් අධ්‍යක්ෂ පවසන ලද්දේ එම ලියවිලි තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ඉදිරියේ ඇය වෙත භාර දුන් බවත්, අභ්‍යන්තර විගණක විසින් ද එම කමිටුව නියෝජනය කළ බවත්ය.	ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ පරිපාලන ගැටලු රැසක් පවතින බවත්, එබැවින් මෙම රෝහලේ කටයුතු ක්‍රමානුකූල කිරීමට කටයුතු කිරීම සහ කාරක සභාවට ප්‍රගතිය වාර්තා කිරීම.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්/ රෝහල් සභාපති	ප්‍රගතිය වාර්තා කර නොමැත.	**<u>ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ පරිපාලන ගැටලු රැසක් පවතින බවත්, එබැවින් මෙම රෝහලේ කටයුතු ක්‍රමානුකූල කිරීම.</u>** සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කර විශ්‍රාම ගත් පලපුරුදු පරිපාලන නිළධාරීනියකගේ සේවය ලබා ගෙන රෝහලේ පවතින වැටුප් හා පරිපාලන ගැටළු නිරාකරණය කිරීමට පියවර ගෙන ඇත.

					<u>පරිපාලන නිලධාරි තනතුරේ වැඩ භාර භාර ගැනීම.</u> මේ වන විට ස්ථිර පරිපාලන නිලධාරියෙකුගේ ප්‍රධාන අඩුවක් පවතින අතර අනෙකුත් තනතුරු වල මෙන්ම මෙම තනතුරේද වැටුප් පරිමාණයේ ගැටළුවක් පවතින බැවින් එම ගැටළු නිරාකරණය කර ගන්නා තෙක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කළ පළපුරුදු නිළධාරිනියක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත. එම නිළධාරිනියට පරිපාලන නිලධාරි තනතුරට අදාළ සියළුම ලිපි ලේඛන විධිමත්ව භාර දී ඇත.
20.	**<u>රෝගීන්ගේ දත්ත ගබඩා කිරීම.</u>** රෝගීන්ගේ තොරතුරු ගබඩා කර ගැනීමේ ක්‍රියා පිළිවෙළහි වර්තමාන කාර්ය සාධනය පිළිබඳව කාරක සභාව විමසූ අතර, ඒ සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ භාර වෛද්‍ය නිලධාරී විසින් පවසන ලද්දේ ; • දැනට electronic health records system එකක් ක්‍රියාත්මක වන බව, • මෙය තවදුරටත් ව්‍යාප්ත කරගෙන යන බව, • එමඟින් දැනට වෛද්‍ය සායන තුළ රෝගීන්ගේ දත්ත ගබඩා කිරීම සහ රසායනාගාර තුළ රෝගීන්ගේ දත්ත ගබඩා කිරීම සිදු කරන බව සහ • මෑතක දී X-කිරණ පරීක්ෂණ තොරතුරු පවත්වාගෙන යාම සඳහා ද මෙම ක්‍රමය භාවිතා කරන බවයි. මේ සම්බන්ධයෙන් PC House මඟින් ලබා ගන්නා ලද සේවාව පිළිබඳ කාරක සභාව විමසන ලදි. එම සේවාව අතරමඟදී බිඳ වැටීමත් සමඟ පරිපාලනයේ අනුමැතිය සහිතව එම				**<u>රෝගියා රෝහලට ඇතුළත් වන අවස්ථාවේදීම ඔහුගේ දත්ත පරිගණකගත කිරීමේ නව ක්‍රමවේදයක් සඳහා යොමු වීම.</u>** රෝහල තුල ක්‍රියාත්මක පරිගණක පද්ධතිය මඟින් මෙම කාරණයට අදාලව පහත කාර්යයන් දැනටමත් ඉටු කරමින් පවතී. • නේවාසික ප්‍රතිකාර සඳහා ඇතුළත්වන රෝගීන්, බාහිර රෝගී අංශයට පැමිණෙන රෝගීන් හා හදිසි ප්‍රතිකාර අංශය සඳහා පැමිණෙන රෝගීන් සියළු දෙනාගේම ලියාපදිංචි කිරීමේ කාර්ය සම්පූර්ණයෙන්ම පරිගණක පද්ධතිය මඟින් සිදු කිරීම. • හදිසි ප්‍රතිකාර අංශයේ සහ නේවාසික රෝගීන්ගේ රෝහල් බිල්පත් සැකසීමේ කටයුතු සම්පූර්ණයෙන්ම පරිගණක පද්ධතිය මඟින් සිදු කිරීම. • සායනික රෝගීන් ලියාපදිංචි කිරීම

	සමාගමේම උප කොන්ත්‍රාත්කරුවෙකු විසින් එම කටයුතු සිදු කරන බව මෙහිදී තවදුරටත් කාරක සභාවට අනාවරණය විය.				සහ ඉදිරි පැමිණිය යුතු දින ලබා දීම සම්පූර්ණයෙන් පරිගණක පද්ධතිය මඟින් සිදු කිරීම. • වෛද්‍ය සායනයේ සහ දියවැඩියා රෝග සායනයේ රෝගීන්ගේ සායනික තොරතුරු සෘජුව පරිගණක වැඩසටහනට ඇතුළත් කිරීම. • රසායනාගාර පරීක්ෂණ වාර්තා පරිගණකය මඟින් අදාල අංශ තුළදි අවශ්‍ය අයුරින් දර්ශනය කිරීමේ හැකියාව තිබීම. • රසායනාගාර වාර්තා අන්තර්ජාලය මඟින් රෝගීන්ට ලබා ගැනීමට හැකියාව ඇති කිරීම. • එක්ස් කිරණ වාර්තා පරිගණකය මඟින් අදාල අංශ තුළදි අවශ්‍ය අයුරින් දර්ශනය කිරීමේ හැකියාව තිබීම. • 2023 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රතිකාර ගෙන බැහැර යන රෝගීන් සඳහා නියම කරන බෙහෙත් රෝහලෙන් නිකුත් කිරීමටද පරිගණක පද්ධතිය උපයෝගී කර ගනු ලැබේ. • රෝහලින් බැහැර යන නේවාසික රෝගීන්ගේ රෝග විනිශ්චය කාඩ්පත පරිගණක වැඩසටහන මඟින් ලබාදීම ආරම්භ කර තිබීම. පරිගණක හා තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥ උපදේශන සේවාවක් බාහිරින් ලබා ගැනීම සිදු කර දැනට පවතින රෝහල් පරිගණක පද්ධතිය පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමට හා ඉදිරි රෝහල් අවශ්‍යතා සපුරන ආකාරයට එම පද්ධතිය සංවර්ධනය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂ
21.	<u>රෝගීන් පිළිබඳ දත්ත.</u> රෝගීන්ගේ විස්තර පරිගණකගත කිරීමේ වර්තමාන තත්ත්වය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. ඒ සම්බන්ධයෙන් රෝහලේ වෛද්‍ය වාර්තා නිලධාරි විසින් අදහස් දක්වමින් පවසන ලද්දේ, • නීතිපතිගේ නියෝගය අනුව ස්කෑන් කරන ලද ලියකියවිලි මූලික ලිය කියවිලි ලෙස අධිකරණයට ඉදිරිපත් කළ නොහැකි බවත්, • ඒ බැවින් වෛද්‍ය සායනය සහ දියවැඩියා රෝග සායනයට අදාළ තොතුරු සෘජුවම දත්ත ගබඩාවට ඇතුළත් කිරීමට වර්තමාන කළමනාකරණය තීරණය කළ බවත්, • මෙම සායන දෙක සඳහා දිනකට රෝගීන් 200ක් පමණ පැමිණෙන බවත් සහ එම රෝගීන්ගේ දත්ත, දත්ත පද්ධතියට සෘජුවම ඇතුළත් කරන බවත්, • වර්තමාන කළමනාකරණ තීරණයට අනුව මෙම දත්ත ඇතුළත් කිරීම වෙනත් සායන සඳහාද ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, • මෙම ක්‍රමවේදය මඟින් කාර්යය මණ්ඩලය අඩු කළ හැකි බවත් දැනටමත් එය සිදු වී ඇති බවත්, • ඒ නිසා ඇතුළත් වන රෝගීන්ගේ ලිපිගොනු පමණක් ලිපිගොනු ලෙස ස්කෑන් කර පසුව දත්ත ගබඩාවට ඇතුළත් කරන බවත් ය.	i. ස්කෑන් කිරීමේ ක්‍රියා පටිපාටිය පැරණි ක්‍රමයක් බවත්, ඒ සඳහා විශාල පිරිවැයක් බාහිර ආයතන සඳහා ගෙවිය යුතු බැවින්, රෝගියා රෝහලට ඇතුළත් වන අවස්ථාවේදීම ඔහුගේ දත්ත පරිගණක ගත කිරීමේ නව ක්‍රමවේදයක් සඳහා යොමුවීම. ii. එම දත්ත පර්යේෂණ කටයුතු වලට භාවිතා කරන්නේ නම් පළමු අවස්ථාවේදීම ඒ සඳහා රෝගියාගේ කැමැත්ත ලබා ගැනීම.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්/ රෝහල් සභාපති	ප්‍රගතිය වාර්තා කර ඇත.	

					මණ්ඩලය තීරණය කර ඇත. එම උපදේශන සේවාව ලබා ගැනීමේදී රෝගීන්ගේ සායනික තොරතුරු හා නේවාසික රෝගීන්ට අදාල තොරතුරු කෙසේ පරිගණකගත කරන්නේ ද යන්න පිළිබඳ උපදෙස් ලබා ගැනීම අනිවාර්ය අංගයක් බවට නම් කර ඇත. ඒ අනුව ඒමඟින් ලබා දෙන විශේෂඥ උපදෙස් පදනම්ව රෝහල් පරිගණක පද්ධතිය සංවර්ධනය කිරීමට රෝහල් කළමනාකරණය කටයුතු කරමින් පවති. **<u>රෝගි දත්ත පර්යේෂණ කටයුතු වලට භාවිතා කරන්නේ නම් පළමු අවස්ථාවේදීම රෝගියාගේ කැමැත්ත ලබා ගැනීම.</u>** පර්යේෂණ කටයුතු සඳහා රෝගීන්ගේ දත්ත කවර ආකාරයකින් යොදා ගැනීම සිදු කරන්නේ ද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලබයි.
22.	**<u>පෞද්ගලික ප්‍රතිකාර සේවය.</u>** විශේෂඥ වෛද්‍යවරුන් රෝහල තුළ පෞද්ගලික ප්‍රතිකාර සේවයේ යෙදීම සම්බන්ධයෙන් අය කරන වෘත්තීය ගාස්තු සම්බන්ධව පහත පරිදි ගැටලු සහගත තත්ත්වයක් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී. • මෙම ගනුදෙනු ගිණුම් ගත කිරීම සම්බන්ධයෙන් ගැටළු පවතින බවත්, • විශේෂඥ වෛද්‍යවරුන්ට ගෙවන ගෙවීම් ලේඛණගත වීම හෝ ගිණුම්ගත වීම සිදු නොවන බවත්, ඒ සඳහා වෙනම ලදුපතක් මගින් ගෙවීම් කටයුතු සිදු කරන බවත්, • විශේෂඥ වෛද්‍යවරුන්ට ගෙවන				**<u>වෘත්තීය ගාස්තු සම්බන්ධ ගැටලු</u>** • වෘත්තිය ගාස්තු ගෙවීම් systolic පද්ධතිය හරහා රෝගියාගේ බිලේම සඳහන් කිරීමේ ක්‍රමවේදයක් 2022 ඔක්තෝබර් මස 25 සිට රෝහල විසින් ආරම්භ කර ඇත. • එසේම වෘත්තිය ගාස්තු නියාමනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක්ද ගෙන ඇත. • ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ නේවාසික රෝගීන් සඳහා පිලියෙල කරන බිල්පත් සාමාන්‍ය වාට්ටු හා ගෙවන වාට්ටු ලෙස වර්ග කර ඇත. එහිදී ගෙවන වාට්ටු වලට ඇතුලත් වන රෝගීන් සඳහා විශේෂඥ

	මෙම වෘත්තීය ගාස්තු සාමාන්‍ය ක්‍රමවේදය තුළ තිබිය යුතු බවත්, • එමඟින් ආයතනයට ලැබෙන්නේ 0.15% ක ප්‍රතිශතයක් බවත්, • 2021 වසරේ විශේෂඥ වෛද්‍යවරුන්ට ගෙවූ මුළු වෘත්තීය ගාස්තුව වූ ආදායම රු.මිලියන 388 න් රෝහලේ අදායමට බැර කර තිබූ සේවා ගාස්තුව රු.583,035/- ක් පමණක් බවත්, • 2020 වසරේ අදායම රු. මිලියන 363.17 ක් බවත්, එයින් රෝහලේ අදායමට බැර කර තිබූ සේවා ගාස්තුව රු.546,035/- බවත්, • ආයතනයේ උපකරණ මේ සඳහා භාවිතා කරන බවත්ය. මේ සම්බන්ධයෙන් විශේෂඥ වෛද්‍ය/රෝහල් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික පවසන ලද්දේ; • පෞද්ගලික රෝහල්වල ශල්‍යාකර්ම සිදු කිරීමේදී අයවීම් සිදු වන ආකාරය උදාහරණයක් ඇසුරෙන් පහදමින් ශල්‍යාකර්මයක් සඳහා රෝගියා විසින් රු.200,000/-ක් පමණ ගෙවන්නේ නම්, එයින් විශේෂඥ වෛද්‍යවරයාගේ වෘත්තීය ගාස්තුව රු.70,000/- ක් සහ රු.130,000/- ක් රෝහල් ගාස්තු වන බවත්, • විශේෂඥ වෛද්‍යවරයාගේ මෙම වෘත්තීය ගාස්තුවෙන් කිසිදු ප්‍රතිශතයක් රෝහලට නොලැබෙන බවත්, • පෞද්ගලික රෝහල්වල රෝහල් ගාස්තුව සඳහා ගෙවන රු. 130,000/- න් සියළු වියදම් ආවරණය කර ගන්නා බවත්, • ජයවර්ධනපුර රෝහලේ තත්ත්වය ද එයට සමාන බවත්ය,				වෛද්‍යවරුන් විසින් අයකරනු ලබන මුදලින් 0.15% ක් රෝහලට අය කර ගනු ලබයි. • එහි කිසිදු වෙනසක් ඇති නොකර රෝහලේ නේවාසිකව හා සායනික වශයෙන් ප්‍රතිකාර ලබන රෝගීන්ගෙන් අයකර ගනු ලබන මුදල් සම්බන්ධයෙන් මිල ප්‍රතිපත්ති සමාලොචනයක් (Pricing Policy review) කිරීමට කමිටුවක් පත් කරන ලදී. කමිටු සාමාජිකයන්, I. වෛද්‍ය චන්ද්‍රගුප්ත රණසිංහ මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩ බලන) - කමිටු සභාපති II. විශේෂඥ වෛද්‍ය සී.සී. කාරියවසන් මෙනවිය III. විශේෂඥ වෛද්‍ය එච්.ආර්.වයි. ද සිල්වා මහතා IV. විශේෂඥ වෛද්‍ය ඩබ්ලිව්.ජී.ආර්.සී.කේ.සිරිසේන මහතා V. ආර්.එම්.ආර්.ගුණවර්ධන මිය. නීති නිළධාරී/රෝහල් මණ්ඩල ලේකම් VI. පී.ඒ.එස්.එල්.පී.පෙරේරා මයා (සහකාර ගණකාධිකාරී) VII. වෛද්‍ය පී.එස්.අමරතුංග මිය. (සැලසුම් හා තත්ත්ව පාලන) මෙම කමිටුව විසින් සිදු කරනු ලබන මිල ප්‍රතිපත්ති සමාලෝචනයෙන් (Pricing Policy review) පසුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරේ.

	මේ සම්බන්ධයෙන් තවදුරටත් අදහස් දක්වමින් ජයවර්ධනපුර රෝහලේ තත්ත්වය පිළිබඳව විශේෂඥ වෛද්‍ය/රෝහල් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික පවසන ලද්දේ, • සෑම මසකම 10 වන දින වෘත්තීය ගාස්තු තම ගිණුම්වලට බැර වන බවත්,එම මුදලින් 0.15% ක මුදලක් තම ගිණුම් වලින් රෝහල සඳහා අය කර ගන්නා බවත්; වෙනත් පෞද්ගලික රෝහලක ශල්‍යකර්ම සිදු කරන්නේ නම් අදාළ පෞද්ගලික රෝහල එසේ අය කිරීමක් සිදු නොකරන බවත්, • ජයවර්ධනපුර රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් රෝහල සඳහා වැඩි දායකත්වයක් ලබා දෙන බවත්, 0.15% ක මුදලක් තම ගිණුම් වලින් රෝහල සඳහා අය කර ගැනීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බවත්, එම මුදල තවදුරටත් වැඩි කිරීමට අවශ්‍ය වන්නේ නම් අනිකුත් විශේෂඥ වෛද්‍යවරුන් සමඟ සාකච්ඡා කිරීම යෝග්‍ය බවත්, වෙනත් කිසිදු පෞද්ගලික රෝහලක සිදු කරනු ලබන ශල්‍යකර්මවලට ගෙවනු ලබන වෘත්තීය ගාස්තුවෙන් විශේෂඥ වෛද්‍යවරයාගෙන් වෙනත් කිසිදු අය කිරීමක් සිදු නොකරන බවත්ය. මේ සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය දැනුවත් වී නොමැති බවත්, විශේෂඥ වෛද්‍යවරයාගේ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් තමා සැහීමට පත් වන බවත්, තවදුරටත් මේ පිළිබඳව අධ්‍යයනය කරන බවටත් විගණකාධිපති විසින් සඳහන් කරනු ලැබූ අතර ඒ සඳහා කාරක සභාවේ එකඟතාව පළ විය.				

23.	**<u>රෝගීන්ට සවස 4.00න් පසුව පැමිණෙන ලෙස දැන්වීම.</u>** දහවල් කාලය තුළ පරීක්ෂණ සඳහා පැමිණෙන රෝගීන්ට එම පරීක්ෂණ සඳහා සවස 4.00 න් පසුව පැමිණෙන ලෙස දැන්වීම පිළිබඳ කාරක සභාව ප්‍රශ්න කළාය. මේ පිළිබඳව විශේෂඥ වෛද්‍යවරුන් දැනුවත් කල බවත්, ඒ පිළිබඳව පරිපාලනය දැඩි අවධානයෙන් සිටින බවත්, රෝහල් අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැන්වීය.				මේ පිළිබඳ කළමනාකරණය දැඩි අවධානයෙන් පසු වන අතර මෙවැනි කටයුතු සිදු වන්නේනම් එය වලක්වන ලෙස අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව ද දැනුවත් කර ඇත. මේ වනවිට මෙවැනි අක්‍රමිකතා සිදු නොවේ.
24.	**<u>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ යෝජනා.</u>** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කරන ලද්දේ 2021 වසරේ මෙම රෝහල සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු.බිලියන 2ක් ලබා දී තිබෙන බවත් 2022 වර්ෂයේ ඔක්තෝබර් දක්වා පුනරාවර්තන වියදම් ලෙස රු. බිලියන 1.8 ක් ලබා දී තිබෙන බවත්ය. මෙහිදී කාරක සභාවට අනාවරණය වූයේ, • එක් ආයතනයක් වෙනුවෙන් අතිවිශාල මුදලක් වෙන් කර තිබෙන බව, • එම නිසා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අදහස වනුයේ පිරිවැය පිළිබිඹු වන, පිරිවැය ක්‍රමයකට යා යුතු බවත්, මූලික වශයෙන් සමතුලිතතා ලක්ෂ්‍යයේවත් (Breakeven Point) සිටිය යුතු බව, • සංයුක්ත සැලැස්ම (Corporate Plan) සාදන විට මෙම රෝහල රෝගීන්ට ලබා දෙන සත්කාර උපරිම වශයෙන් ලබා දෙන ලෙසත් හා පෞද්ගලික	i. කාරක සභාව විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීන්දු තීරණ ගැනීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව සලකා බැලීම. a) රෝහල් අභ්‍යන්තරයේ විවිධ අංශවල විවිධ ගැටුම් පවතින බැවින් ඒවා නිරාකරණය කිරීම විශේෂඥ වෛද්‍යවරුන් සිය කැමැත්තෙන් කටයුතු කිරීමට සුදානම් බවට ප්‍රකාශ කිරීම නිසා සියලුම කාර්යය මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමට එම විශේෂඥ වෛද්‍යවරුන්ට අවස්ථාව දීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගැනීම. b) පිරිවැය කළමනාකරණය සහ රෝහල් කළමනාකරණය සඳහා කාරක සභාවක් පත් කිරීම.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්/ රෝහල් සභාපති	ප්‍රගතිය වාර්තා කර නොමැත.	**<u>අති විශාල මුදලක් එක් ආයතනයක් වෙනුවෙන් වෙන් කර තිබෙන බව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අදහස අනුව පිරිවැය පිළිබිඹු වන පිරිවැය ක්‍රමයකට යා යුතු බව සහ මූලික වශයෙන් සමතුලිතතා ලක්ෂ්‍යයේවත් (Break-even Point) සිටිය යුතු බව.</u>** මෙම රෝහල ශ්‍රී ලංකාවට පවතින වෙනම ආකෘතියක රෝහලකි. එනම් සම්පූර්ණයෙන් ගාස්තු නිදහස් සේවය සපයන රජයේ රෝහල් සහ සම්පූර්ණයෙන්ම පුද්ගලික මට්ටමින් පවත්වාගෙන යන රෝහල් අතර; අතරමැදි මට්ටමක පවතින රෝහලකි. ඒ අනුව අතරමැදි ආර්ථික තත්වයක සිටින රෝගීන්ට සේවය ලබා දීමේ අරමුණින් මෙම රෝහල ස්ථාපිත කර ඇත. මෙහිදී රෝගීන්ගේ පරීක්ෂණ හා ශල්‍ය කර්ම සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල විසින් අයකරනු ලබන ගාස්තු, පුද්ගලික රෝහල් හා සසඳන විට අඩු මට්ටමක පැවතීම විශේෂ කරුණකි.

	මට්ටමින් හෝ ඉන් ඔබ්බට ලබා දීමට උත්සහ කරන ලෙසත්, එවිට සමතුලිතතා ලක්ෂ්‍ය වත් (Breakeven Point) හෝ ඉන් ඔබ්බට යාමට හැකි නම් එසේ ක්‍රියාත්මක කරන ලෙස, • 2021 වසර අවසානයේ දී රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයක් නිකුත් කළ බව, • රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් 2021 වසරේ නිකුත් කළ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 හි අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් යන තනතුරේ කාර්යභාර්ය කුමක්ද යන්න පැහැදිලිව සඳහන් කර ඇති බව, • මේ ආයතනවල පරිපාලනය ගෙන යන විට ආයතනික පාලන රාමුව (Corporate Governance Framework) තුළ සිටිය යුතු බව, • මේ තුළ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සඳහා විශාල කාර්යභාරයක් පැවරෙන බව , • අධ්‍යක්ෂ මණ්ඩලය ගන්නා තීරණ ක්‍රියාත්මක වීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගෙන් ලැබෙන දායකත්වය වැදගත් බව, • මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ආයතනයේ වෙනත් තනතුරු නොදැරිය යුතු බව සහ එම තනතුර ස්වායීන විය යුතු බව, • නමුත් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්,නීති නිලධාරී ලෙසද කටයුතු කරන බව, • මේ ආයතනයට අදාල සුවිශේෂී නීති ගැටළු ඇති බැවින් මෙම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුර වෙනම				නිදසුනක් ලෙස; Appendectomy ශල්‍යකර්මය සඳහා පුද්ගලික රෝහල් වල රු.450,000/- ක් පමණ අය කරන තත්ත්වයකදී අප රෝහලේ ගෙවන වාට්ටු වල රු.250,000/- ක් පමණ ද සාමාන්‍ය වාට්ටු වල රු 80,000/- ක් පමණ ද අය කරන බව පෙන්වා දිය හැකිය. එසේම රෝහල් ගාස්තු අඩු මට්ටමක පවත්වා ගනිමින් රෝගීන්ට විශාල සේවාවක් අඩු මුදලකට ලබා දීමට සහ ශ්‍රී ලංකාවේ නන්දෙසින් රෝහලට පැමිණෙන පුජ්‍ය පක්ෂයට රෝහල විසින් විශාල වියදමක් දරමින් බෙහෙත් සමඟ ප්‍රතිකාර නොමිලේ ලබා දීමටත් හැකි වී ඇත්තේ රජයෙන් ලබා දෙන ප්‍රදානය හේතුවෙනි. එබැවින් එසේ රජයෙන් ලබා දෙන ප්‍රදානය සාධාරණ වන අතර මෙම සේවාව අඛණ්ඩව රෝගීන් වෙත ලබා දීම සඳහා මෙම ප්‍රදානය ඉතා වැදගත් වේ. පුද්ගලික රෝහල් මෙන් ලාභ ලබන තත්ත්වයකට රෝහල ගෙන යෑමේදී අයකරන සියළුම ගාස්තු ඉහළ දැමීමට සිදු වන අතර එයින් රෝහල පිහිටුවීමේ මූලික අරමුණ බිඳී යයි. එසේ වුවද ආදායම ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අලුතින් සේවාවන් රැසක් ආරම්භ කිරීමටත් පවතින සේවාවන්ගේ ගුණාත්මය ඉහල දැමීමටත් ඉහත සඳහන් කළ පරිදි පියවර රැසක් මේ වන විට ගෙන ඇත. තවද, වියදම අඩු කිරීමට කටයුතු කිරීමද ඉතා වැදගත් වේ. එහිදී පුද්ගලික

	තනතුරක් විට යුතු බව සහ • මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ආයතනයට පරිභාහිරව ලබා ගත හැකි බවත (outsource), විශේෂඥ වෛද්‍ය/රෝහල් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික විසින් මෙහිදී යෝජනා කරන ලද්දේ; • රෝහලට පැමිණෙන රෝගීන් බොහෝ වේලාවක් පෝලිම්වල රැඳී සිටින බවත් එයට පිළියමක් ලෙස පුද්ගලික රෝහලක මෙන් මහජන සබඳතා නිලධාරියෙක් (Public Relation Officer) පත් කිරීමට සහ රෝගියාගේ අවශ්‍යතාවය අනුව අවශ්‍ය ස්ථානයට යොමු කිරීමට යෝජනා කළ බවත්, • රෝගීන් සඳහා දැරීමට සිදු වන ඒ ඒ වියදම් සඳහා වෙනමම පැකේජ සහ අත් පත්‍රිකා සැදීමට යෝජනා කළ බවත්, • මෙම රෝහල සඳහා Bed Management Allocation System එකක් නොමැති බවත්, ඒ සඳහා රෝහලට bed manager කෙනෙක් පත් කිරීමට යෝජනා කළ බවත්, • රෝගියාගේ වාර්තා දුරකථනයට ලැබෙන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කළ බවත්, • කාර්යය මණ්ඩලයේ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා වැඩ සටහන් පැවැත්වීමට යෝජනා කළ බවත්ය.				රෝහල් වල මෙන් නොව අප රෝහලේ ස්ථිර සේවක මණ්ඩලයක් සිටින බැවින් සේවක වැටුප ස්ථාවර වියදමක් ලෙස සැලකීමට සිදුවේ. එනම්, රෝගීන් රෝහලට නොපැමිණෙන තත්වයකදී වුවද රෝහලේ ස්ථිර සේවක වැටුප් ගෙවීමට සිදුවේ. එබැවින් එම සාධකය අඩු කිරීමට නොහැකි වන අතර රෝහලේ වියදම අඩු කිරීම සඳහා; • රජයේ වෛද්‍ය සැපයීම් අංශයෙන් අවශ්‍ය බෙහෙත් ලබා ගැනීමට කටයුතු කිරීම, • සුර්ය බල ශක්ති උපයෝගී කර ගනිමින් විදුලි වියදම අඩු කර ගැනීමට කටයුතු කිරීම, • ජල වියදම අඩු කර ගැනීම සඳහා ලිං ජලය භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු කර ගෙන යාම • පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය කර අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට පියවර ගැනීම යනාදී කටයුතු සිදු කරමින් බවති. එසේ ආදායම වැඩි කර ගැනීමටත් වියදම අවම කර ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බැවින් එයින් ඉදිරියේදී ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සමතුලිත ලක්ෂය කරා පැමිණි පසුව ලාභ ලබන තත්වයටද පැමිණෙනු ඇතැයි බලාපොරොත්තු වේ. **<u>2021 වසර අවසානයේ දී රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයක් නිකුත් කළ බව.</u>** රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ රෝහල් කළමනාකරණයේදී භාවිතයට ගැනේ. මේවන විට රෝහලේ පිරිවැය විශ්ලේෂණය කිරීමක් ආරම්භ කර ඇති අතර ස්ථාවර වත්කම් කළමනාකරණය

					සඳහාද ක්‍රමවේදයක් ආරම්භ කර ඇත. **<u>මේ ආයතනවල පරිපාලනය ගෙන යන විට Corporate Governance Framework තුළ යා යුතු බව.</u>** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තුමා සමග කටයුතු කරමින් Corporate Governance Framework තුළ කටයුතු කිරීමට උපරිම උත්සහ කරනු ලැබේ. **<u>අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුර හා නීති නිලධාරී තනතුර.</u>** • අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ට අදාළ බොහෝ කරුණු වලදී නීතිමය ගැටලු හා සම්බන්ධ කරුණු පවතී. එසේම අධ්‍යක්ෂ මණ්ඩලය නිතරම තීරණ ගත යුත්තේ නීතිමය පදනමකිනි. එබැවින් විශාල කාර්යභාරයක් නීති නිලධාරී විසින් සිදු කරනු ලබයි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් නීති නිලධාරී වීමේ විශේෂ වාසි පවතී. • තනතුරු දෙකම සඳහා ස්ථිර පදනමකින් 2019 දී නිලධාරිනියක බඳවා ගෙන ඇති අතර මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හා නීති නිලධාරී තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගෙන ඇත. **<u>මහජන සබඳතා නිලධාරී (Public Relation Officer)</u>** රෝහලට පැමිණෙන රෝගීන් හා අමුත්තන් පිළිගෙන අවශ්‍ය අංශ වෙත යොමු කිරීම සඳහා රෝහල් කාර්යය

					මණ්ඩලයේ සාමාජිකාවන් තිදෙනෙකු පුහුණු කොට වඩාත් ගුණාත්මක සේවාවක් ලබා දීම ආරම්භ කර ඇත. **<u>Bed Management Allocation System</u>** රෝහලේ ඇති රෝගී ඇඳන් සහ කාමර ඵලදායි ලෙස යොදා ගැනීම සඳහා රෝගීන් ඇතුළත් කිරීමේ අංශය සහ හෙද පාලිකා කාර්යාලය සම්බන්ධීකරණය වෙමින් රෝගීන්ට අවශ්‍ය ඇඳන් සහ කාමර වෙන් කර ගැනීමේ කාර්යය මේ වන විට ආරම්භ කර ඇත. දුරකථන අංකය - 070 3 679 679 **<u>රෝහල් පරීක්ෂණ හා ශල්‍යාකර්ම වලට අදාල මිල ගණන් තොරතුරු</u>** රෝගීන් සඳහා දැරීමට සිදු වන ඒ ඒ ව්‍යදම් සඳහා වෙනමම පැකේජ හදුන්වා දී ඒ සඳහා රෝහල් Web Site යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කොට ඇත. http://sjgh.health.gov.lk/pricing.php **<u>රෝගීන්ගේ පරීක්ෂණ වාර්තා මාර්ග ගත ක්‍රමයට යැවීම</u>** රෝගීන්ගේ පරීක්ෂණ වාර්තා මාර්ග ගත ක්‍රමයට ඔවුන් වෙත යැවීමට කටයුතු කර ඇත. **<u>කාර්යය මණ්ඩලයේ ආකල්පමය වෙනසක් ඇති කිරීම</u>** කාර්යය මණ්ඩලයේ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා වැඩ සටහන් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

					<u>කළමනාකරණ උපදේශක සභාවක් නම් කර ඇත.</u> පිරිවැය කළමනාකරණය සහ රෝහල් කළමනාකරණය සඳහා අවශ්‍ය නිර්දේශ හා යෝජනා ලබා ගැනීම සඳහා රෝහලේ සියලුම කාර්ය මණ්ඩලය සහ වෘත්තීය සමිති නියෝජනය වන පරිදි මේ වන විට කළමනාකරණ උපදේශක සභාවක් පත් කර ඇත.
25.	<u>කාරක සභාවේ තීරණ</u> i. ශ්‍රී ජයවර්ධනපුර රෝහල් කාර්ය මණ්ඩලය නැවත වතාවක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීම. ii. මින් ඉදිරියේදී කාරක සභාව හමුවට ආයතන කැඳවීමේ දී පෙර සේවය කළ භාණ්ඩාගාර නියෝජිත ද කැඳවීම. iii. රෝහල සම්බන්ධයෙන් සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විශේෂ වාර්තාවක් විගණකාධිපතිගෙන් කැඳවීම. iv. රෝහලට පැමිණ ආයතනික පරීක්ෂාවක් සිදු කිරීම සඳහා අනු කාරක සභාවක් පත් කිරීම.				

වෛද්‍ය රමේෂ් පතිරණ
සෞඛ්‍ය අමාත්‍ය

වෛද්‍ය රමේෂ් පතිරණ පා.ම.
සෞඛ්‍ය අමාත්‍ය
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය" අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි මාවත,
කොළඹ 10.

දිනය 24/02/12